# 2013 – 11 – 05 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය :-

| | | |
|---|---|---|
| **01.** | **එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා** | ගරු සභාපති |
| 02. | **කමල් වැල්ලගේ මහතා** | ගරු උප සභාපති |
| **03.** | **ඒ. පී. ලක්ෂමි හේමන්තා සිල්වා මෙනවිය** | ගරු නගර සභා මන්ත්‍රී |
| **04.** | **එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| **05.** | **එච්. එල්. අනුර කිත්සිරි මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| 06. | **පී. සරත් ශ්‍රීලාල් මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| **07.** | **ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| **08.** | **ඒ. ඩබ්. ජගත් කුමාර මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| **09.** | **ජේ. ඩබ්. ජයන්ත මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| **10.** | **ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| **11.** | **කේ. එම්. චන්ද්‍රසිරි මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| **12.** | **බී. ජනිත් වික්‍රමතිලක මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |

☸ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ. ව. 09.45 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.** ☸

## (01)

### 01:01 2013 – 10 – 08 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම

2013 – 10 – 08 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව 2013 – 10 – 08 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**සංශෝධන 01**

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන**

2013 – 10 – 08 දින පැවති මාසික සභා වාර්තාවේ 10:2 යටතේ 56 පිටුවේ පළමු කියමන අවසානයෙහි “ මම දෙයක් ඉදිරිපත් කරනවට වඩා මෙතුමිය ඉදිරිපත් කරහම ඒ දේ වෙනවා ” යයි යන්න “ මම දෙයක් කිව්වම එක විදියකටත්, තවත් අයෙක් කිව්වහම තව විදියකටත්, විවිධ අවස්ථාවන්හි එකම දෙය විවිධාකාරයෙන් ක්‍රියාත්මක වෙනවා ලෙස නිවැරදි විය යුතුයි.

**සංශෝධන 02**

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන**

2013 – 10 – 08 දින පැවති මාසික සභා වාර්තාවේ 11:1 යටතේ 60 පිටුවේ මාගේ ප්‍රකාශය “අපි මොවුන්ට දන්වමු නගරයට අලංකාර වන පරිදිත් දේශීය හා විදේශීය සංචාරකයන්ට නිවැරදි මාර්ගෝපදේශකත්වය ලැබෙන පරිදිත් මෙය ස්ථාපිත කරන්න කියලා ” ලෙස නිවැරදි විය යුතුයි.

**සංශෝධන 03**

2013 – 10 – 08 දින පැවති මාසික සභාවේ අංක 12:5 හි තීරණය “මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී ” ලෙස මුද්‍රණය වී ඇති අතර එය “පොල්වත්ත පාරේ සිට ජනත් චන්ද්‍රසිරි මහතාගේ නිවස දක්වා ප්‍රවේශවන මාර්ගය නගර සභාවට පවරාගෙන සංවර්ධනය කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී ” ලෙස සංශෝධනය විය යුතුයි.

**(02)** සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන — නැත

**(03** ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**3:1** “ නගර අලංකරණය යටතේ කටවුට් හෝල්ඩින් හා ප්‍රචාරක පුවරු ඉවත් කිරීම ” මැයෙන් 2013 -10 - 11 දාතමින් දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය ලේකම් විසින් සියලුම ලේකම්වරුන් අමතන ලද ලිපිය අනුව ඔබ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුල විධිමත් කමිටුවක නිර්දේශ මත ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කිරීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කරන ලෙස දන්වා තිබුණි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලේකම්තුමා, මුලස්ථාන පොලිස් පරීක්ෂකතුමාගෙන් ඉල්ලීමක් කරන්න පොලිස් ස්ථානයෙන් නිලධාරියෙක් නම් කරන්න කියලා. ඊට අමතරව ලේකම් මහතා සහ ප්‍රධාන ආදායම් කළමනාකරණ සහකාර මහත්මිය කමිටුවේ සාමාජිකයන් ලෙස මා යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>තීරණය</u>**

☞ **අදාල කමිටුව සඳහා නගර සභාවේ ලේකම්තුමා, ප්‍රධාන ආදායම් කළමනාකරණ සහකාර මිය සහ අම්බලන්ගොඩ පොලිස් ස්ථානයෙන් නම් කරන ලද නිලධාරියෙක් පත් කර මෙම කාර්ය ඉටු කිරීම සුදුසු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව සභා අනුමැතිය ලබා දෙන ලදී.**

3.2 “ SD/2013/106 අංක සහ ජේ. එල්. අනිල් හේමසිරි, 21/9, ශ්‍රී විජයාරාම පාර, කලුවඩුමුල්ල, අම්බලන්ගොඩ යන ලිපිනය දරණ අනුබෙදුම ” සභාගත කිරීම.කරන ලදී.

ජේ. එල්. අනිල් හේමසිරි මහතා විසින් ඉදිරිපත් කර ඇති ඉඩම් අනුබෙදුම සඳහා ආදායම් පරිපාලක මහතා විසින් අයකල යුතු 1% ගාස්තුව ලෙස රු. 35200/- ක මුදලක් අය කල යුතු බව දන්වා තිබෙන අතර ඔහු විසින් ඉදිරිපත් කර ඇති දිව්රුම් ප්‍රකාශය අනුව මෙම ඉඩම් කැබලි විකිණීම පිණිස නොව තම දරුවන් අතර බෙදාදීම සඳහා වන බවත් දන්වා තිබුණි.

**<u>තීරණය</u>**

☞ **මාදුවගේ තේජසිරි මහතා විසින් මැන සාදන ලද අංක 1606B දරණ පිඹුරේ ලොට් 4A, 4B, 4C යන ඉඩම් කැබලි ජසෙන්තු ලියන ඔම්ලා සුරංජනී සහ ජසෙන්තුලියන ප්‍රශාන් මංජුල යන අයගේ නම් වලට හැරවීමේදී පමණක් 1% ගාස්තු අය නොකිරීමටත් වෙනත් නමකට හැරවීමේදී එම ගාස්තු අය කල යුතු බවට වරිපනම් ලේඛනයේ සටහන් කිරීමටත් සභාව තීරණය කරන ලදී .**

3.3 “ අම්බලන්ගොඩ අ. ම. කරුණාරත්න දෙටු පුරවැසි පියසට ප්‍රවේශ වන මාර්ය අ. ම. කරුණාරත්න මාවත ලෙස නම් කිරීම ” මැයෙන් දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්තුමා වෙත යවන ලද ලිපියේ පිටපත සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ අ. ම. කරුණාරත්න දෙටු පුරවැසි පියසට ප්‍රවේශ වන මාර්ය අ. ම. කරුණාරත්න මාවත ලෙස නම් කිරීමට දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව දන්වා තිබුණි.

“ අම්බලන්ගොඩ අ. ම. කරුණාරත්න දෙටු පුරවැසි පියසට ප්‍රවේශ වන මාර්ය අ. ම. කරුණාරත්න මාවත ලෙස නම් කිරීම ” මැයෙන් දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ අ. ම. කරුණාරත්න දෙටු පුරවැසි පියසට ප්‍රවේශ වන මාර්ය අ. ම. කරුණාරත්න මාවත ලෙස නම් කිරීමට නගර සභා ආඥා පනතේ 55 (අ) වගන්තිය ප්‍රකාරව දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව දන්වා තිබුණි.

තීරණය

☞ **දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය පරිදි අම්බලන්ගොඩ අ. ම. කරුණාරත්න දෙටු පුරවැසි පියසට ප්‍රවේශ වන මාර්ය අ. ම. කරුණාරත්න මාවත ලෙස නම් කිරීමටත් ඒ සඳහා අදාල ගැසට් කිරීම් සිදු කිරීමටත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .**

☞ **පෙ ව 10.00 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා සභාවට පැමිණෙන ලදි.**

3.4 " අම්බලන්ගොඩ නගර සභාවේ ගරු නගරාධිපති නිල බලයෙන් සිංහ ක්‍රීඩා සමාජයේ ගරු සභාපති හැටියට ව්‍යවස්ථානුකූලව පත් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම " මැයෙන් සිංහ ක්‍රීඩා සමාජයේ සභාපති හා ලේකම් විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදි.

සිංහ ක්‍රීඩා සමාජය අම්බලන්ගොඩ ප්‍රදේශයෙන් ක්‍රිකට් ක්‍රීඩකයන් බිහිකිරීම සඳහා විශාල දායකත්වයක් දක්වන බවත් අම්බලන්ගොඩ නගර සභාව අතීතයේ සිට මේ දක්වා සිංහ ක්‍රීඩා සමාජය වෙත මහත් සහයෝගයක් ලබා දී ඇති බවත් සිංහ ක්‍රීඩා සමාජයේ කාරක සභාව රැස්වී නගර සභාවේ නගරාධිපති නිල බලයෙන් සිංහ ක්‍රීඩා සමාජයේ සභාපති ලෙස පත්විය යුතු බවට තීරණය කල බවත් ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙම ඉල්ලීම අපට කාරුණිකව ප්‍රතික්ෂේප කරන්න වෙනවා. මොකද නගර සභාවේ සභාපතිවරයා එක් ක්‍රීඩා සමාජයක නිල බලයෙන් සභාපති වුනොත් ඒක සමහර වෙලාවට වෙනත් ක්‍රීඩා සමාජ සහ පාසල් සඳහා කරන යම් අසාධාරණයක් වෙන්න පුලුවන්. සභාපතිවරයා කවුරු වුනත් පොදුවේ ක්‍රියා කරන්න ඕනෙ. මගේ පුද්ගලික මතය ඒක. සභාවෙ අදහස් අනුව ඉදිරි කටයුතු කරමු.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

සභාපතිතුමනි ඔබතුමා සභාපතිවරයා වශයෙන් පාසල් සහ සියලුම ක්‍රීඩා සමාජවල උන්නතිය සඳහා නිරතුරුව සහයෝගය ලබා දෙනවා. ඔබතුමා ප්‍රමුඛ මෙම ගරු සභාව සිංහ ක්‍රීඩා සමාජයට දක්වන ලද සහයෝග මෙහිදී එළි දක්වල තියෙනවා. සිංහ ක්‍රීඩා සමාජය ඒ සඳහා කරන සැලකිල්ලක් වශයෙන් තමයි මෙම ඉල්ලීම කරල තියෙන්නෙ. මෙහිදී ඔබතුමා බුද්ධිමත් තීරණයක් ගත්තෙ. නගරයේ නගරාධිපතිවරයා සියලු සංවිධාන සඳහා එකසේ සිටිය යුතුයි. එසේ කල හැකි වන්නෙ නගරාධිපතිවරායා ස්වාධීන වුනහොත් පමණයි. ඒනිසා ඔබතුමා ගත් තීරණයට අපේ කෘතඥතාවය පල කර සිටිනවා.

තීරණය

☞ **නගර සභාවේ සභාපතිවරයා එක් ක්‍රීඩා සමාජයක පමණක් තනතුරු දැරීම යෝග්‍ය නොවන බැවින් සහ සියලුම ක්‍රීඩා සමාජ සඳහා සහයෝගය ලබා දිය යුතු බැවින් මෙම ඉල්ලීම සභාව විසින් කාරුණිකව ප්‍රතික්ෂේප කරන ලදී .**

3.5 “ පළාත් පාලන ආයතනවල ආදායම් අයකර ගැනීම ” මැයෙන් දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

පළාත් පාලන ආයතන වාර්ෂික ආදායම් අයකර ගැනීමේදී වාර්ෂික අයවැය ලේඛනය අනුව ඒවා අය කර නොගන්නා බව පෙනි යන බවත් එය නිසිලෙස ආයතනයේ කාර්යන් කිරීමට බාධාවක් වි ඇති බවත් එබැවින් සියලු පළාත් පාලන ආයතන මාසිකව පිළියෙල කරනු ලබන ආදායම් වාර්තා ඉදිරි මස 10 දිනට පෙර පිළියෙල කර සභා රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුලත් කරන ලෙසත් එම වාර්තාවේ පිටපතක් සෑම මසකම 15 දිනට පෙර දිස්ත්‍රික් සහකාර කොමසාරිස්වරුන්ට ද ඇතුලුව තමා වෙත ඉදිරිපත් කල යුතු බවත් දැනටමත් මෙවැනි වාර්තාවක් පිලියෙල නොකරන්නෙ නම් මේ සමග එවනු ලබන ආකෘතිය අනුව කටයුතු කරන ලෙසත් මෙම උපදෙස් ක්‍රියාත්මක කිරීම ඔබ පළාත් පාලන ආයතනයේ උන්නතියට බෙහෙවින් ඉවහල් වන බවත් දන්වා තිබුණි.

<u>තිරණය</u>

☞ **මාසිකව පිළියෙල කරනු ලබන ආදායම් වාර්තා සකස් කිරීමේදී අදාල චක්‍රලේඛනය අනුව ක්‍රියා කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .**

**(04)** යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ **නැත**

**(05)** යථා පරිදි කල්දී ඇති යෝජනා

**5:1 ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා නැත**

**5:2 නිලධාරීන් විසින් ඉදිරිපත් කරන පරිපාලන යෝජනා**

**05:02:01** පහත සඳහන් කරුණු ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා පරිපාලන යෝජනාවක් ලෙස ගරු සභාවට ඉදිරිපත් කරමි.

1. 2014 වර්ෂයට වරිපනම් බදු ගෙවීම සඳහා වු නිවේදනය

2. 2014 වර්ෂයට බලපත්‍ර ගාස්තු හා බදු පැනවීම සඳහා නගර සභා ආඥා පනතේ 162, 164(I), 162(අ), 165(අ) iii වගන්ති වලට අනුව මේ සමග අමුණා ඇති උප ලේඛන අංක 01, 02, 03, 04, 05, 06 පරිදි බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු, ඇතැම් ඉඩම් විකිණීම් මත 1% බදු, රථ වාහන හා සත්ව බදු, නගර සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන වෙළඳ ව්‍යාපාර හා කර්මාන්ත වලින් පනවා ඇති බදු අය කිරීමට.

3. ඉහත සඳහන් නිවේදන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා ඉංග්‍රීසි හා දෙමළ භාෂාවට පරිවර්තනය කර ගැනිම සඳහාද අනුමැතිය පතමි.

2014 වර්ෂයට වරිපනම් බදු ගෙවීම සඳහා වූ නිවේදනය පල කිරීම සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

2014 වර්ෂයට බලපත්‍ර ගාස්තු හා බදු පැනවීම සඳහා නගර සභා ආඥා පනතේ 162, 164(I), 162(අ), 165(අ) iii වගන්ති වලට අනුව මේ සමග අමුණා ඇති උප ලේඛන අංක 01, 02, 03, 04, 05, 06 පරිදි බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු, ඇතැම් ඉඩම් විකිණීම් මත 1% බදු, රථ වාහන හා සත්ව බදු, නගර සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන වෙළඳ ව්‍යාපාර හා කර්මාන්ත වලින් පනවා ඇති බදු අය කිරීම සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

.

<u>තීරණය</u>

☞ **2014 වර්ෂයට වරිපනම් බදු , බලපත්‍ර ගාස්තු හා බදු පැනවීම්, කර්මාන්ත බදු, ඇතැම් ඉඩම් විකිණීම් මත 1% බදු, රථ වාහන හා සත්ව බදු, නගර සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන වෙළඳ ව්‍යාපාර හා කර්මාන්ත වලින් පනවා ඇති බදු, ප්‍රචාරණ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා බදු සහ වෙනත් ගාස්තු අය කර ගැනීමට ගැසට් නිවේදනයේ පල කිරීම සඳහාත් මෙම ගැසට් නිවේදනයේ ඉංග්‍රීසි භාෂාවට සහ දෙමළ භාෂාවට පරිවර්තනය කිරීමට යොමු කිරීම සඳහාත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

## (06) කාරක සභා වාර්තා සලකා බැලීම

**6: 1** **2013- 10- 10** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා මුලාසනය දැරූ</u>**
**<u>2013/10/10 දින පුස්තකාල කමිටු වාර්තාවයි.</u>**

- ඩී.වී. සුනිල් මහතා — ලේකම්
- කේ.එච්. මෙලානි මධුෂා මිය — පුස්තකාලයාධිපතිනි
- ටී. නදීකා නිල්මිණි මෙනවිය — සංවර්ධන නිලධාරී
- පීනේන්ද්‍රවංශ ද සිල්වා මහතා — කමිටු සාමාජික
- සිරිපාල මාදුවගේ මහතා — කමිටු සාමාජික
- ටී.ඩබ්. පියසිරි මහතා — කමිටු සාමාජික

- ටී.ඩබ්. හරිශ්චන්ද්‍ර මහතා — කමිටු සාමාජික
- සුගත් හෙට්ටි ආරච්චි මහතා — කමිටු සාමාජික
- එන්. එච්. ඩන්කන් ද සිල්වා මහතා — කමිටු සාමාජික
- පී.ඩබ්. ගුණසිරි මහතා — කමිටු සාමාජික
- ජේ.ඩබ්.ජේ. ද සිල්වා — කමිටු සාමාජික
- පී.එච්.එල්. පියන්ති මෙනවිය — පුස්තකාල සාහායිකා
- ඒ.ඩබ්. ඉන්ද්‍රදාස මයා — පුස්තකාල සාහායක
- ගෞරී වර්සවිතාන මිය — පුස්තකාල සාහායිකා
- ඒ.පී ලක්ෂමී පෙරේරා මෙනවිය — පුස්තකාල සාහායිකා
- ඒ.පී. රසිකා මිය — පුස්තකාල සාහායිකා
- එම්.ඩබ්.ජේ. සුමංගලී මිය — පුස්තකාල සාහායිකා
- එස්.එම්. මනෝරි චන්ද්‍රවංශ මිය — පුස්තකාල සාහායිකා
- කේ.ඒ. විසුද්ධි රේණුකා මිය — පුස්තකාල සාහායිකා
- මාලනී ආරියසිංහ මිය — පුස්තකාල සාහායිකා

ගරු සභාපතිතුමා කමිටුවට පැමිණි මහත්ම මහත්මීන් පිළිගැනීමෙන් පසු එදින ප.ව. 2.30ට සභාවේ වැඩ ආරම්භ කළේය.

- පුස්තකාල ප්‍රගති වාර්තා කමිටුවට ඉදිරිපත් කිරීම පළමුව සිදුවිය.

ප්‍රධාන පුස්තකාලයේ ප්‍රගති වාර්තාව ප්‍රධාන පුස්තකාලයේ පුස්තකාල සහායක ඒ.ඩබ්. ඉන්ද්‍රදාස මයා විසින් ද, අනෙකුත් ශාඛා පුස්තකාලවල ප්‍රගති වාර්තා එම ශාඛා භාර නිලධාරීන් විසින් ද, ඉදිරිපත් කරන ලදී.

**වෙනත් කරුණු :-**

කියවීම් මාසයේ උත්සවයට පෙර පවත්වන කමිටු රැස්වීම මෙය බැවි ගරු සභාපතිතුමා ප්‍රකාශ කළේය. සෑම කමිටු රැස්වීමක් අවසානයේ ශාඛා පුස්තකාලවල පාඨක අදහස් පොත් නිරීක්ෂණය කොට එයට අවශ්‍ය පිළියම් ලබාදීමට සභාපතිතුමා ගත් තීරණයට කමිටු සාමාජික මහතුන්ගේ ප්‍රසාදය හිමිවිය.

ගරු සභාපතිතුමා විසින් පාසල්වල ළමයින්ට තරග ප්‍රතිඵල ලේඛන ලැබීමට සැලැස්වීම ගැන පුස්තකාලයාධිපතිනියගෙන් කරුණු විමසන ලදී. පුස්තකාලයාධිපතිනියට පුස්තකාල සහායිකාවන්ගේ සහාය ලබා ගැනීමට හැකිවන පරිදි වැඩ කොටස් බෙදාදීමෙන් එම කාර්ය හොඳින් කළ හැකි බව ගරු සභාපතිතුමා පැවසුවේය.

කමිටු සාමාජික ජස්ටින් මහතා කියා සිටියේ එම පාසල්වල ළමයින් දැනුවත් වීමට නම් විදුහල්පතිතුමාට, පංතිභාර ගුරුවරයාටත්, ඒ අංශය අදාල ගුරුතුමාටත් ප්‍රතිඵල ලේඛනයේ පිටපතක් ලබාදෙන ලෙසයි.

රැස්වීම් ශාලාව තුළ පෙ.ව. 7.30 වනවිට ළමයින් අසුන්ගත කළයුතු බවත්, පිළිගැනීම ධර්මාශෝක විද්‍යාලය අසළ බවත් කී ගරු සභාපතිතුමා ඒ ගැන පුස්තකාලයාධිපතිනිය දැනුවත් කළේය. සංස්කෘතික ඇමතිතුමා උත්සවයට සහභාගිවන බැවින් පිළිගැනීමේ තොරණ ප්‍රදේශයේ යම් අනන්‍යතාවයක් පිළිඹිබු වන ලෙස ඉදිකරන ලෙස කමිටු සාමාජික මහතුන්ගේ තීරණයට සභාපතිතුමා කැමැත්ත ප්‍රකාශ කළේය. පළමුව ජාතික ගීය ගායනාකොට කොඩි ඔසවා, පිරිත් සජ්ජායනා කිරීමද, පොල් තෙල් පහන දැල්වීම ද සුදුසු බැවි තීරණය විය.

රැස්වීම් ශාලාව සායම් කොට අළුත්වැඩියා කිරීමට ගරු සභාපතිතුමා වැඩ අධිකාරී මහතා කැඳවා උපදෙස් දුන්නේය. විද්‍යුත් පුස්තකාලය සඳහා වෙබ් අඩවියට සහභාගිවීමට ළමයින් කීපදෙනෙකු සහභාගි කරවන ලෙස ගරු සභාපතිතුමා විසින් පුස්තකාලයාධිපතිනිය දැනුවත් කරන ලදී. නියෝජ්‍ය කථානායකතුමා විසින් පොත් පරිත්‍යාග කිරීමෙන්

පසුව දේශකතුමාගේ කථාව පැවැත්වීම සුදුසු බැව් කමිටු සාමාජික මහතුන්ගේ තීරණයට ගරු සභාපතිතුමා කැමැත්ත ප්‍රකාශ කළේය.

ජයග්‍රාහී තරග කරුවන් තිදෙනාට අමතරව එම තරගවල 10වෙනි ස්ථාන දක්වාද සහතික ලබාදීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා පුස්තකාලයාධිපතිනියට උපදෙස් දුන්නේය. වේදිකාව සැරසීමේදී ස්වභාවික මල් හා පරිගණක ආශ්‍රයෙන් අකුරු කපාගෙන කියවීම් මාසයේ උත්සවය නිමාකිරීම සුදුසු බැව් සභාපතිතුමා විසින් දැනුවත් කරන ලදි. සහතිකපත් හා ත්‍යාග ලබාදීමට කාර්යාලයේ සේවය කරන රාමනායක මහත්මිය, සෙව්වන්දි මහත්මිය, සාගරිකා මහත්මිය සහභාගිකරගෙන නිසිපරිදි එම කටයුත්ත සපුරන ලෙස පුස්තකාලයාධිපතිනියට උපදෙස් දුන්නේය.

ගෞරී මහත්මිය කියා සිටියේ ශාඛාවල තරග පැවැත්වූ බවත් සහතිකපත් නගර සභාවෙන් ලබාදීමට කටයුතු කරන ලෙසයි. එහිදී ගරු සභාපතිතුමා පැවසුවේ සහතිකපත් හා ත්‍යාග ලබාදීමට එම ප්‍රදේශයේ නාගරික මන්ත්‍රීවරුන්ගේ සහාය ලබාගන්නා ලෙසයි.

<u>2013/09/12 කමිටු වාර්තාවේ සංශෝධන :-</u>

01. කමිටු සාමාජික සුගත් හෙට්ටි ආරච්චි මහතා උත්සවයට ආරාධනා කරන ලෙස පැවසූ ගුවන් විදුලි සංස්ථාවේ සභාපති මොහාන් සමරසිංහ මහතා යනුවෙන් වැරදි ලෙස සඳහන්වී ඇති බැව් ද එය හඩ්සන් සමරසිංහ මහතා යනුවෙන් නිවැරදි විය යුතු බැව් සුගත් හෙට්ටි ආරච්චි මහතා පෙන්වා දුන්නේය.

වෙනත් කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු සභාපතිතුමා ස්තුති කථාව සඳහා ලේකම් මහතාට ආරාධනා කළේය. එහිදී එතුමා ස්වේච්ඡාවෙන් කමිටුවට පැමිණි කමිටු සාමාජික මහතුන්, පුස්තකාලයාධිපතිනිය හා පුස්තකාල කාර්ය මණ්ඩලයට ස්තුතිය ප්‍රකාශ කරමින් කමිටුවේ වැඩ අවසන් කළේය.

**ඒ අනුව 2013 -10- 10 දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මම මේ අවස්ථාවේදී මතක් කරනව අපේ විද්‍යුත් පුස්තකාලයේ සාමාජික ගාස්තුව මාසෙකට රු. 250 ක් කියල අපි යෝජනා කරා. ඒ මුදල රු. 100 ක් දක්වා අඩු කරන්න කියල මම යෝජනා කරනවා. අපි ලාභ ලබන ආයතනයක් නෙමෙයි. අපේ දුප්පත් දරුවන්ට සේවයක් වෙන විදියට අපි ඔවුන්ට අවස්ථාවක් ලබා දෙන්න ඕනෙ. එයට කවුරුත් විරුද්ධ නැහැ නේද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මහින්ද චින්තන වැඩපිළිවෙල යටතේ තාක්‍ෂණය ගමට ගෙන යෑමේ පරමාර්ථය තුල ඔබතුමා විසින් මේ සභාව තුලින් අපේ නගරයට අවශ්‍ය පහසුකම් සපයල තියෙනවා. ඒ තුල මෙය භාවිතා කිරීමේ මාසික ගාස්තුව රු. 100 දක්වා අඩු කිරීම සම්බන්ධව අපි කෘතඥතාවය පල කරනවා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අද අපේ ජනිත් මන්ත්‍රීතුමාගෙ මොකක්හරි වෙනසක් තියෙනවද?

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

සභාපතිතුමනි අපි දේශපාලන මතිමතාන්තර වශයෙන් දෙපැත්තක සිටියත් අපේ සහෝදර ජනිත් මන්ත්‍රීතුමා ප්‍රගතිශීලි අදහස් දරන තරුණ මන්ත්‍රීවරයෙක් හැටියට එතුමාගේ ඉදිරි දේශපාලන ගමනට අපි මේ අවස්ථාවේ සුබ පතනවා. අපේ මහින්ද චින්තන වැඩ පිළිවෙල යටතේ එතුමාට සුබ අනාගතයක් පතමින් නිහඬ වෙනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි දීර්ඝ කාලයක් අපේ සභාව නියෝජනය කරපු සහෝදර මන්ත්‍රීවරයෙක් වශයෙන් එතුමාට අපි සුභ පතනවා. එතුමා අම්බලන්ගොඩ ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ නව ආසන සංවිධායක ධුරයෙන් පිදුම් ලැබීම පිළිබඳව අපේ සතුට අපි මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. අපි දන්න කාලය තුල අම්බලන්ගොඩ ආසනයේ සංවිධායක ධුරය ඉතා ඉක්මනින් වෙනස්වීම් වලට භාජනය වුනා. ඒ නිසා එක්සත් ජාතික පක්ෂ ආසන සංවිධායක ධුරයේ දිගු කලක් රැඳීමට අපි එතුමාට සුබ පැතුම් එක් කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමනි ජනිත් වික්‍රමතිලක මහතාට අපි සුභ පතනවා. මම තමයි එතුමා එක්කගෙන ගියේ. මම නිර්දේශ කරා දෙන්න කියලා. මම 1965 ඉඳල දේශපාලනය කරා. මට තමයි ආරාධනය ආවෙ මේක කරන්නයි කියලා කරු ජයසූරිය මහත්මයල, රනිල් වික්‍රමසිංහ මහත්මයල, තිස්ස අත්තනායක මහත්මයලගෙන්. මම හිතන දෙයක් තමයි දේශපාලනය කරන්න නම් සල්ලි තියෙන්න ඕනෙ. ඒ නිසා මම පළාත් සභාවටවත් එන්නෙ නැහැ. ඒකටත් මට එන්න කිව්වා. මම මෙතෙන්ට මුලින්ම එක්කගෙන ගියේ දේවි මහත්මයා. එතුමාත් මේ වෙලාවෙ ගන්න බැහැයි කියල කිව්ව. ඊට පස්සෙ මට පුද්ගලිකවම කතා කරහම මම කිව්ව නායක තුමාට වෙන්න ඕනෙ මේකයි කියලා. ජනිත් වික්‍රමතිලක මහත්මයට සංවිධායක කම දෙන්න කියලා. අද පක්ෂයේ මොකක්හරි දෙයක් වෙනව නම් මගෙන් තමයි අහන්නෙ මොකක්ද කරන්නෙ කියලා. ඊයෙ කෘතපාධිකාරි මණ්ඩලයේදි තිරණය කරල තියෙනව අම්බලන්ගොඩ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයා වශයෙන් පත්කරන්න තිරණය වෙලා තියෙනවා. අපි දේශපාලනය හරියට කරපු අයට ඉදිරියට යන්න ඉඩ දෙනවා කිසිම පැකිලීමක් නැතුව. ජනිත් මන්ත්‍රීතුමාට අවුරුදු 21 ක විතර පලපුරුද්දක් තියෙනවා. ඒ නිසා මේක අපි කැමැත්තෙන්ම දීපු දෙයක්. මම ජ්‍යෙෂ්ඨයා කියලා පළපුරුද්ද වැඩියි කියලා එහෙම දෙයක් නැහැ අපේ. අපිට අවශ්‍ය මේකට සුදුස කෙනෙක් පත් කරල අපේ පක්ෂයේ පාක්ෂිකයන් ආරක්ෂා කරගෙන ඉදිරියට යන්න. මේක තමයි දේශපාලනය කියන්නෙ. සමහර අය බොහොම ඉක්මනට ඉස්සරහට යන්න හදනවා. ඒ අයට වැඩිය දුර ගමනක් යන්න බැහැ. අපිට මොන බාධක ආවත් මම මේ පක්ෂය අත ඇරල යන්නෙ නැ. ඒක නායකත්වයත් දන්නව. අපේ පක්ෂෙ අය තමයි තමුන්නාන්සේලාගේ පක්ෂෙ ආරක්ෂා කරන්නෙ. එහෙම නොයන පිරිසකුත් ඉන්නවා. අපිට ඡන්දය දීපු අය තමයි අපි මෙතෙන්දි ආරක්ෂා කරන්නෙ පනින්නෙ නැතුව. අපේ ජනිත් මන්ත්‍රීතුමා සැහෙ කාලයක් අපේ පක්ෂෙ ඉඳපු කෙනෙක්. එතුමා ලබන වර පළාත් සභාවට තරග කරනවා. එතුමාට අපි සුභ පතනවා. ජනතාවගේ සහයෝගය ලබා ගෙන ඒ ජයග්‍රහණ කරා යාමට හැකිවෙන්න කියලා. ජනතාව අතර ඉඳගෙන ජනතාවත් සමග ඉදිරියටම යන්න ලැබේවා කියල තුනුරුවන්ගෙ සරණ පතනවා. ඒවගේම දෙවියන්ගෙ පිහිට පතනවා සියලු ජයග්‍රහණ ලබාගෙන ඉදිරියට යන්න අවස්ථාව ලැබෙන්න කියලා.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේවි රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි අම්බලන්ගොඩ එක්සත් ජාතික පක්ෂ සංවිධායක ධුරයෙන් පිදුම් ලබන සහෝදර මන්ත්‍රී ජනිත් වික්‍රමතිලක මැතිතුමාට ප්‍රථමයෙන්ම මගේ අවංක ආදර ස්තුතිය එතුමන්ට පුදකරනවා. වසර 23 ක වගේ දීර්ඝ කාලයක් අම්බලන්ගොඩ ජනතාවට සේවය කරල එතුමාට විශාල අත්දැකීම් සම්භාරයක් තියෙනවා. ඒවගේම එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරුන් ගණනාවක් එක්ක වැඩ කරල එතුමාට පල පුරුද්ද තියෙනවා. එක්සත් ජාතික පක්ෂ සංවිධායක ධුරයට සුදුසුම පුද්ගලයා මම හිතන්නෙ පත් වෙලා තියෙනවා. ඒ සම්බන්ධයෙන් මම අවංකවම සතුටු වෙනවා. එතුමාගේ

සියලු කටයුතු සාර්ථක වෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා. පළාත් සභාවෙන් නොනැවතී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට ශක්තිය ලැබේවා කියල මගේ සුබ පැතුම් එක් කරනවා. ඔබතුමාගේ සියලු කටයුතු ඉටු වේවා. ඒවගේම අපේ තවත් සංවිධායකතුමෙක් ඉන්නවා. එතුමාටත් අපි සුබ පතනවා. අපි හතර දෙනාගෙන් දෙන්නෙක්ම දැන් සංවිධායකවරු ශ්‍රී ලංකාවෙ ප්‍රධාන පක්ෂ දෙකක. එතුමාගෙ වැඩ කටයුතුත් සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වෙන්න කියල මම මේ අවස්ථාවෙ සුබ පතනවා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මම මේ වෙලාවෙ අපේ ජනිත් වික්‍රමතිලක මන්ත්‍රීතුමාට සුබ ප්‍රාර්ථනා කරනවා. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහය තුල එක්සත් ජාතික පක්ෂය පවතින පක්ෂයක්. නමුත් අම්බලන්ගොඩ එක්සත් ජාතික පක්ෂ පාක්ෂිකයො පසුගිය කාලය තුල අතරමංවෙලා හිටියේ. ඒ අය එක් තැනකට ගොනුකර ගැනීම ඔබතුමන්ලාගේ කාර්යභාරයක්. අපේ නාගරික මන්ත්‍රීවරයෙකුට මෙම පක්ෂයේ සංවිධායක ධූරය ලැබීම සම්බන්ධව අපි ඇත්තටම සතුටු වෙනවා. ඒවගේම ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුනේ සංවිධායක ධූරයත් අපේ චන්ද්‍රසිරි මන්ත්‍රීතුමාට ලැබුන කියලත් කියවුනා. එකම පක්ෂයක දෙන්නෙක් සංවිධායකවරු ලෙස සිටීමත් දුලබ අවස්ථාවක්. මම ඔබ දෙපලටම සුබ පතනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මම ප්‍රථමයෙන්ම ජනිත් මන්ත්‍රීතුමාට සුබ පතනවා. ඒවගේම මගේ නාම කිසිම අදහසක් නැහැ පක්ෂය හැර යන්න. මට ඒකට තව ටික කාලයක් අවශ්‍ය වෙනවා. ඊට පස්සෙ මම තීරණයක් ගන්න බලාපොරොත්තු වෙනවා. ඒ ගැන හරි තීරණයක් මට මේ අවස්ථාවෙදි දෙන්න බැහැ. මගේ සහෝදර සරත් ෆොන්සේකා මහත්මයා මගෙන් ඉල්ලීමක් කරල තියෙනවා. නමුත් ඒකට මම ස්ථිර වචනයක් දීල නැහැ. තවමත් මම එක්සත් ජාතික පක්ෂයේ රැඳී ඉන්න තීරණය කරල තියෙනවා. මම ජනිත් වික්‍රමතිලක මන්ත්‍රීතුමාට සුබ පතමින් මම නිහඬ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි නිකලැල් උසස් චරිත ලක්ෂණ ඇති පුද්ගලයො මතුවන්නෙ ප්‍රදේශයේ පිනට. එවැනි සුවිශේෂ චරිතාංගයන්ගෙන් සමන්විත ජනිත් වික්‍රමතිලක චරිතය ඉහලට එසවෙන වෙලාවෙ නගරෙ වැසියෙක් හැටියට කෙරම්ණිය පින්නදූව ප්‍රදේශයේ නියෝජිතයා හැටියට මම හදවතින්ම සතුටු වෙනවා. එතුමා සමග පක්ෂ හැටියට කිසිම බෙදීමක් අපි අතර ඇතිවුනේ නැහැ. ඒවගේම එතුමා ඇත්ත යුත්ත දුටු තැන ප්‍රකාශ කරනවා. එනිසා මම හිතනවා එතුමාට පෙර ලකුණු තියෙනවා ඉදිරියට යන්න. එතුමාට සුබ පැතුම් හදවතින්ම පතමින් කෙරම්ණිය පින්නදූව වැසියන්ගේ ප්‍රසාදය පල කරමින් නවතිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි එක්සත් ජාතික පක්ෂය සඳහා වැදගත් කාර්ය භාරයක් ඉටු කල අම්බලන්ගොඩ නගර සභාවේ අවුරුදු 23 ක කාලයක් නාගරික මන්ත්‍රීවරයෙකු ලෙස ඉඳල අද දින එක්සත් ජාතික පක්ෂ ප්‍රධාන සංවිධායක ධූරයට පත් කරන අවස්ථාවේ අපි හදවතින්ම සුබ පතනවා. නගර සභා මන්ත්‍රීවරයෙක් ලෙස පක්ෂ භේදයකින් තොරව අපිට එතුමාගෙන් සහයෝගය ලැබුනා. ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ වශයෙන් තරගයක් ඇති වන්න පක්ෂ විපක්ෂ දෙකක් තිබිය යුතුයි. එහෙම ‘රගයක් ඇති කරන්න අම්බලන්ගොඩ නගරය තුල එක්සත් ජාතික පක්ෂයෙන් සංවිධායකවරයෙක් හිටියෙ නැහැ. කෙසේ හෝ අපේ විපක්ෂනායකතුමා උනන්දු වෙලා සංවිධායක ධූරය අරගෙන තියෙනවා. ඒ වෙනුවෙන් අම්බලන්ගොඩ නගර සභාවෙ අපේ සියලු දෙනාගෙ සුබ පැතුම් එක් කරනවා. ඒවගේම දේව් මන්ත්‍රීතුමා කිව්ව වගේ අපේ තවත් මන්ත්‍රීවරයෙක් ඉන්නව. සරත් ෆොන්සේකා මහත්මයගේ පක්ෂයේ සාමාජිකත්වය අරගෙන තියෙන්නෙ මම හිතන්නෙ. අම්බලන්ගොඩ නගර

සභාව තුල නාගරික මන්ත්‍රීවරුන් දෙපලක් සංවිධායක ධූරවලින් පිදුම් ලබනවා. ඒ ගැන අපි සතුටට පත්වෙනවා. ඒ වෙනුවෙන් අම්බලන්ගොඩ ජනතාවගේ සුබ පැතුම් අපි එක්කර සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

සභාපතිතුමනි මම ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාවේදී මම නොසිතපු යෝජනාවක් ගෙන ඒම සම්බන්ධයෙන් ඒ පිළිබඳව අදහස් දැක්වූ ගරු මන්ත්‍රීවරුන්ටත් ගරු සභාපතිතුමාටත්. වසර 23 ක දේශපාලන ගමනක් ඇවිල්ල අද මට ලංකාවේ ප්‍රබලම පක්ෂය වන එක්සත් ජාතික පක්ෂයේ අම්බලන්ගොඩ නගරයේ ප්‍රධාන සංවිධායක ධූරය හිමිවෙලා තියෙනවා. ඒ වෙනුවෙන් මගේ සතුට අම්බලන්ගොඩ ජනතාව වෙනුවෙන් පුද කර සිටිනවා. මගේ තාත්තගේ දේශපාලන පන්නරය තුලින් තමයි මම දේශපාලනයට පිවිසුනේ. 1963 ඉඳගෙන වසර 18 ක් අම්බලන්ගොඩ නගර සභාවෙ වාමාංශික දේශපාලනය නියෝජනය කරපු කෙනෙක් තමයි මගේ පියා. මම හැදුනෙ වාමාංශික දේශපාලන පරිසරයක. මට මතක් වෙනවා අ. ම. කරුණාරත්න මැතිතුමා මම ඉතාමත් ගරු කරන කෙනෙක් විදියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් සෑහෙන කැපවීම් කරපු මහත්මයෙක්. ඒවගේම ඔබතුමාගෙ පියා. සමන් සර් කියල අපි කියන්නෙ. අ. ම. කරුණාරත්න මහත්මයගේ ගෙදරයි ඔබතුමන්ලගෙ ගෙදරයි අපි රැකවරනය ලබපු තැන්. මගේ එක්සත් ජාතික පක්ෂ ගමන ආරම්භ කරන්න සීද්ධ වුනේ හිටපු නගරාධිපති පී. එම්. එස්. ද සිල්වා මහත්මය මගෙන් ඉල්ලීමක් කරා 1991 දී තරුණ කණ්ඩායම යටතේ එක්සත් ජාතික පක්ෂයට තරග කරන්න කියලා. මොකද ඒ වෙනකොට තිබුණ හැල හැප්පීම් තුල පී. එම්. එස්. ද සිල්වා මහත්මයල ජයන්ත මහත්මයල වගේ කට්ටියත් හිටපු මන්ත්‍රීවරයත් එක්ක යම් යම් ගැටලු නිසා අපේ තාත්තලත් ස්වාධීන වෙලා ඒ තුල තාත්තට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් නාම යෝජනා නොදී ඒ ඇතිවුන අරගලයේ ප්‍රතිඵලයක් තමයි එක්සත් ජාතික පක්ෂයට මට ආරාධනා කරේ මේකෙන් තරග කරන්න කියලා. එහිදී මම බෝනස් ලැයිස්තුවෙන් අට වෙනියට මේ නගර සභාවට ඇතුල්වුනා. මම ඉන්න පක්ෂයට මම කැපවීමෙන් වැඩ කරනව කවදත්. ඊට පසු නගර සබාවට මම පස් වතාවක් තරග කරල තියෙනවා. පස් වතාවම දිනල තියෙනවා. එන්න එන්න උඩට ආව මිසක් පල්ලෙහාට ගිහිල්ල නැහැ. මට වෙලාවකට හිතෙනව දෛවයේ සරදමක්ද කියලා. මම එක්සත් ජාතික පක්ෂයේ පළිගැනීම් වලට ලක් වෙච්ච කෙනෙක්. මම 1983 පොලිස් සේවාවෙ විශේෂ කාර්ය බලකාය සඳහා අයදුම්පත්‍රයක් දාල ජගත් සද්ධාසේන මහත්තය මට ගෙදරට විදුලි පුවතක් එවල තිබුණ ඔබට තනතුරක් ලැබිල තියෙනව එන්න කියලා. ජගත් සද්ධාසේන මහත්මයගෙ 18 ක ලැයිස්තුවෙන් මම විතරක් පාක්ෂාකයෙකු නොවීම තුල කැපීමකට ලත් වුනා. ඒ වෙලාවෙ මට දැඩි වේදනාවක් ඇති වුනා. අවුරුදු 18 ක තරුණයෙකු හැටියට. ඒ වෙලාවෙ මට හිතුනා මම දේශපාලන ගමනක් යන වෙලාවකදී මම කිසිම වෙලාවක දේශපාලන පළිගැනීම් කරන්නෙ නෑ කියලා. ඒක මම ක්‍රියාවෙන් ඔප්පු කරල තියෙනවා. බුද්ධික මහත්මය සංවිධායක වශයෙන් ඉන්න කොට එතුමා මගෙන් නිර්දේශ ලබා ගන්න කොට මම පොල්වත්ත ප්‍රදේශයේ ඉන්න ශ්‍රී. ල. නි. පාක්ෂිකයන්ගෙ නම් මම නිර්දේශ කරල මම අද සතුටට පත් වෙනවා. මම එදා ඒ හිතා ගත්ත දේ මම ක්‍රියාවෙන් ඔප්පු කරල තියෙනවා. ඉදිරියටත් මම මගේ දේශපාලන ගමනේ පළිගැනීම් කරන්නෙ නෑ. යම් යම් හිත් රිදීම් වෙනවා දේශපාලන වේදිකාවෙ කතා කරන කොට. දේශපාලන මතිමතාන්තර තුල එවැනි යම් හිත් රිදීමක් වුනානම් විරුද්ධ පක්ෂයේ සියල්ලන්ගෙන් මම සමාව ඉල්ලනවා. මම පළිගැනීම් වලින් තොරව දෝෂාරෝපනයෙන් තොර නිකලැල් දේශපාලනයක් කරන්න බලාපොරොත්තු වෙනවා. මම සංවිධායකවරු හය දෙනෙක් යටතේ දේශපාලන ගමනක් ඇවිල්ල තියෙනවා. මම ඒ දේශපාලන ගමන අවංකව කැපවීමෙන් කරල තියෙනවා. මම නිතරම අපේ ජ්‍යෙෂ්ඨත්වයත් එක්ක තමයි වැඩ කටයුතු කරන්නෙ. අවුරුදු 31 ක අත්දැකීම් තියෙන ජයන්ත මහත්මයට තමයි මේක මුලින්ම ගන්න කිව්වෙ. මම රජයේ සේවකයෙක් නිසා මේ තරම් ඉක්මනට මේක බාරගන්න හිතාගෙන හිටියෙ නැහැ. නමුත් ඊයෙ රාත්‍රි හතට පමණ කෘත්‍යාධිකාරී මණ්ඩලය රැස්වෙලා මගේ නම නිවේදනය කරල තියෙනවා. ඒ සඳහා මට සහයෝගය ලබා දුන් පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහත්මාටත් මම ස්තුති කරනවා. ගෞරව කරනවා. එතුමා රටක් හදන්න පුලුවන් නායකයෙක්. එතුමා 2001 - 2002 කාලසීමාව තුල රට යම් තැනකට ගෙනාව. එතුමාට එදා ජනතා විමුක්ති පෙරමුණත් ජනාධිපතිවරිය හැටියට චන්ද්‍රිකා මැතිණියත් ඒ ගමනට හරස් කරල දේශපාලන ගමන නැවැත්තුවා. එදා ඒ ගමන යන්න දුන්නනම් අද මේ කතා කවුරුවත් මුකුත් කියන්නෙ නෑ. එදා ජනතා විමුක්ති පෙරමුණ දැක්ක රනිල් වික්‍රමසිංහ මහත්මය ගියොත් ඒක වලක්වන්න ඕනෙ කියලා. ඒ හින්ද තමයි එදා එතුමාට වැඩක් කරගන්න බැරි වුනේ. මට ඒවගේම වජිර ඇමතිතුමා උදව් කරා. ජයන්ත මහත්මය ඇතුලු සියලු දෙනා මට

උදව් කරා ආශිර්වාද කරා. ඒ අයගේ ආශිර්වාදය තුලින් මම මේක නිරහංකාර ගමනක් ගිහිල්ල අම්බලන්ගොඩ ආසනයේ ගමක ඉන්නෙ පස් දෙනාද ඒ පස් දෙනත් එක්ක මේ පක්ෂය නගා සිටුවන්නට දායකත්වයක් කැපවීමක් කරනවයි කියල පොරොන්දු වෙමින් මම සම්බන්ධව අදහස් දැක්වූ සහ ස්තුති කරපු සභාපතිතුමා සියලු මන්ත්‍රීවරුන්ට මගේ ගෞරවය ස්තුතිය පුද කරමින් නිහඬ වෙනවා.

☞ **පෙ ව 10.40 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා සභාවට පැමිණෙන ලදි.**

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි මම ප්‍රමාදවීම වෙනුවෙන් සමාව අයදිනවා. නිලධාරිවරුනි, මාධ්‍යවේදී මහතුනි මේ අවස්ථාවේදී මන්ත්‍රීවරුන් විදියට අපට සන්තෝෂ වෙන්න ඕන කාරණාවක්. මන්ත්‍රීවරයෙක් සංවිධායකවරයෙක් වශයෙන් පිදුම් ලැබීම මොන පක්ෂයෙන් වුනත් සුබ පැතීම අපේ යුතුකමක්. ජනිත් මන්ත්‍රීතුමාට එක්සත් ජාතික පක්ෂයෙන් සංවිධායක ධුරය ලැබීම සම්බන්ධව පුද්ගලිකව මම සන්තෝෂ වෙනවා. මොකද මේක විශාල ජයග්‍රහණයක්. ඉතිහාසය අරන් බැලුවම සාමාන්‍ය කෙනෙකුට මේක ගන්න බෑ. එක්සත් ජාතික පක්ෂය මම නියෝජනය කරපු නිසා මම දන්නවා. ඒනිසා ජනිත් මන්ත්‍රීතුමා සංවිධායක ධුරයෙන් පිදුම් ලැබීමම විශාල ජයග්‍රහණයක්. එතුමාට ලැබිච්ච නව තනතුරේ රාජකාරි හොඳින් කරාවි කියල මම විශ්වාස කරනවා. ඒවගේම මම විශ්වාස කරනවා අනිත් අය එතුමාට උදව් කරාවි කියලා. මොකද එක්කෙනෙකුට තනතුරක් දෙනකොට තව කෙනෙක් තරහ වෙනවා. ඒ සියලු දේවල් අමතක කරල පක්ෂයක් විදියට එතුමාට සහාය දේවි. මැතකදී හිටපු සියලුම සංවිධායකවරුන්ට ඒ තත්වය තිබුන සභාපතිතුමනි. මෙතුම ගැන අපට විශේෂත්වයක් තියෙනවා. මෙතුමගේ පියත් මේ සභාව නියෝජනය කරා. ඒනිසා එතුමට අපේ ශක්තියත් ධෛර්යත් දෙන්න තියෙනවා. අපට හැකියාව තිබෙනවා දේශපාලන වශයෙන් නොවුවත් යම් ආකාරයෙන් උදව්වක් එතුමාට ලබා දෙන්නට මන්ත්‍රීවරුන් විදියට. එතුමාගේ සංවිධායක ධුරයේ කටයුතු ඉතාම හොඳින් සාර්ථකව ඉටු කර ගැනීමට හැකි වේවා කියල ප්‍රාර්ථනා කරනවා. ඒවගේම එතුමාගෙ කතාවෙ කියවුනා රනිල් වික්‍රමසිංහ මහත්තය හිටිය නම් මේ දේ වෙන්නෙ නෑ කියල. ඇත්ත එතුමා හිටියනම් අද රට කෑලි දෙකක් තමයි තියෙන්නෙ. තනි රටක් අතිගරු ජනාධිපතිතුමාට පින්සිද්ධ වෙන්න තියෙනවා. තමුන්නාන්සේලා ඒ ගැන කණගාටුවෙන්න එපා. තමුන්නාන්සේලාගේ නායකයා වුනත් අපි ඇත්ත පිලිගන්න ඕනෙ. ඒකත් මතක් කරමින් ජනිත් වික්‍රමතිලක මැතිතුමාට එතුමාගේ සංවිධායක ධුරයේ වැඩ කටයුතු සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි පතමින් මම නිහඬ වෙනවා.

**6: 2** **2013- 10- 22** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද අම්බලන්ගොඩ නගර සභාව සහ වෙළඳ සංගමය එක්ව පවත්වන ක්‍රියාකාරි කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව 2013 -10- 22 දින පවත්වන ලද අම්බලන්ගොඩ නගර සභාව සහ වෙළඳ සංගමය එක්ව පවත්වන ක්‍රියාකාරි කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 3** **2013- 10- 03** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව 2013 -10-03 දින පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 4** **2013- 09- 10** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

<u>**අම්බලන්ගොඩ නගර සභාව - ක්‍රීඩා කමිටු රැස්වීම**</u>

දිනය - **2013.09.10**

ස්ථානය - නගර සභා රැස්වීම් ශාලාව

වේලාව - ප.ව. **2.30**

<u>**සහභාගීත්වය**</u>

ඇම්.ඩබ්.අරුණ ප්‍ර2දීප් මහතා - ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව
එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රරම - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව
ඩී.වී.සුනිල් මහතා - ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව
ජී.අශෝක කුමාර මහතා - ක්‍රීලඩා උපදේශක අම්බලන්ගොඩ නගර සභාව
එම්.ඩබ්.ෂර්ලි පද්මසිරි මහතා - ක්‍රී ඩා කමිටු සාමාජික
එම්.ඩබ්.කේෂාන් ප්‍රදහාත්මහතා - ක්‍රීරඩා කමිටු සාමාජික
එස්.කේ.පත්මසිරි මහතා - ක්‍රීඩා කමිටු සාමාජික
සුගත් හෙට්ටි ආරච්චි මහතා - ක්‍රීාඩා කමිටු සාමාජික
ආර්.එච්.ආර්.තාබ්රේාච් මහතා - ක්‍රී ඩා නිලධාරී, ප්‍රාස.ලේ.කාර්යාලය,අම්බලන්ගොඩ
ඩබ්.ඒ.ආර්.ගුරුසිංහ මහතා - ක්‍රී-ඩා ආචාර්ය, ධර්මාශෝක විද්‍යාවලය
එම්.ඩබ්.තරිඳු ප්‍රහාත් - ගා/පී ද එස් කුලරත්න විද්‍යාාලය
එම්.එච්.ජයරත්න මහතා - සොනෙල් ක්‍රිකඩා සමාජය
කේ.ජේ.තාබ්රේ ච් මහතා - රියෝ ක්‍රිඩඩා සමාජය
ඉඳුනිල් එදිරිවික්‍රිමසූරිය මහතා - පාපන්දු පුහුණුකරු අම්බලන්ගොඩ නගර සභාව
ඩබ්.පී.සිල්වා මිය -
සංවර්ධන සහකාර (ප්‍ර.සං. නිලධාරී වැ.බ)

**පිළිගැනීම - ගරු සභාපති - නිතිඥ ඇම්.ඩබ්. අරුණ ප්‍ර දීප් මහතා.**

කිරිගැඩා කමිටුව සඳහා කිර්- ඩා සමාජ නියෝජනය කරමින් පැමිණි නිලධාරීන්,පාසල් වලින් පැමිණි ක්‍රිuඩා භාර ආචාර්ය මහතුන් , ක්‍රිකඩා කමිටු සාමාජික මහතුන් හා නගර සභා කාර්ය මණ්ඩලය ඉතාමත් ගෞරවයෙන් පිළිගනිමින්, ප්‍රිථමයෙන්ම න්‍යාමයපත්‍රා නුකූලව පසුගිය ක්‍රි ඩා කමිටු රැස්වීමේ කරුණු සමාලෝචනය කිරීම සිදු කරන ලදි.

* ක්‍රීඩා පිටියේ ලකුණු පුවරුව අසල පොදු වැසිකිලියක් ඉදි කිරීම පිළිබඳ සාකච්ඡා කරන ලදි. එහිදි වැඩ අධිකාරී තුමා විසින් ලබා දෙන ලද වාර්තාව ඉදිරිපත් කරන ලදි. එම ස්ථානයේ එය ඉදිකිරීම ප්‍රාකයෝගික නොවන බවත් ,ක්‍රීරඩා මණ්ඩපයේ ඇති වැසිකිළිය උදේ සවස විවෘත කර දෙන්නේ නම් එය අගය කොට සලකන බවත් ප්‍රතකාශ කරන ලදි.

**අශෝක කුමාර මහතා**
සිංහ හා රියෝ ක්‍රී ඩා සමාජ වල වැසිකිළි ලබා දෙනවා නම් හොඳ බව කියා සිටින ලදි..

**ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්ර දීප් මහතා.**

**එය ප්රාපයෝගික නොවන බවත් , ක්රීඩා මණ්ඩපයේම වැසිකිළියක් ස්ථාපිත කිරිම යෝග්යක බව තීරණය කරන ලදි.**

තිරණය - **ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්රථදීප් මහතා**

**ක්රියඩා මණ්ඩපය තුල වැසිකිළියක් ස්ථාපිත කිරිම සඳහා වැඩ අධිකාරීගෙන් වාර්තාවක් ලබා ගන්නා ලෙස උපදෙස් දෙන ලදි.**

**බැඩමින්ටන් සංගමයෙන් බදු මුදල් නොගෙවීම පිළිබදව සාකච්ඡා කිරීමට නියමිතවූවද එම සංගමයේ නිලධාරීන් පැමිණ නොසිටීම නිසා එය සාකච්ඡා කිරීම පසුවට කල් තබන ලදි. ඉන් අනතුරව**

**නගර ක්රීඩා** ළෙලට අදාලව ඉදිරියේදී පැවැත්වීමට නියමිත තරග ඉසව් පිළිබඳ හා පැවැත්වෙන දිනයන් පිළිබඳ සාකච්ඡා කරන ලදි.

**අශෝක කුමාර මහතා**
**ක්රි කට් තරග පැවැත්වීමට යෝජිත දින වලදී එය පැවැත්වීමට නොහැකිවී ඇති බැවින් වර්ෂාවෙන් බාධා පැමිණෙන බැවින් එම දිනයන් වලින් පසුව දින තීරණය කරන බව කියා සිටින ලදි.**

**ඉඳුනිල් එදිරිවික්ර්මසූරිය මහතා**
**පාපන්දු තරග කණ්ඩායම් සියල්ල සූදානම් බව පැවසූ අතර එම තරග පැවැත්වීම සඳහා දිනයන් වශයෙන් ඔක්තෝබර් 15, 16,17 දිනයන් යොදා ගන්නා ලදි.**

එම්.ඩබ්.තරිඳු ප්රසභාත්
පැසි පන්දු තරග සැප්තැම්බර් 27,28,29 දිනයන්හිදී පැවැත්වීමට නියමිත බව පවසන ලදි.
මලල ක්රීඩා තරඟ නොපැවත්වීමට තීරණය කරන ලදි.

**ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්රදදීප් මහතා**

ප්ර ජා සංවර්ධන නිලධාරීනියට වැඩ රාජකාරි අධික බැවින් නගර ක්රීඩා තරග පිළිබඳ රාජකාරී කටයුතු සංවර්ධන සහකාර එම්.ජී.ආර්.පුෂ්පකුමාර මහතාට පැවැරීමට යෝජනා කර සිටි අතර එම මහතා කැඳවා එම රාජකාරිය භාර ගැනීමට කැමැත්ත විමසා සිටි අතර එම මහතා විසින් එය භාර ගැනීමට කැමැති බව කියා සිටින ලදි.

වෙනත් **අදහස් හා යෝජනා**

එම්.ඩබ්.කේෂාන් ප්රමහාමිණිතා
වෙරළ උද්යානයේ ඇති ජීවිත ආරක්ෂතක කබා ඩොල්ෆින් ජල ක්රීඩා සමාජයට ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

තීරණය - **ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්රලදීප් මහතා**

**සභාවේ අනුමැතිය ලබා ගෙන එය ලබා දීමට කටයුතු කරන බව ප්රතකාශ කරන ලදි.**

එස්.කේ.පත්මසිරි මහතා
CHANGING ROOM අවට වැලි අතුරා ඇති ස්ථානයේ කොන්ක්රීට් ගල් අතුරා සකස් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

තීරණය - **ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්රකදීප් මහතා**

ගල් ගෙනත් දමා ඇත්තේ දුම්රිය මාර්ගයට යටින් පාර සකස් කිරීමට බවත්, ඒවා ඉතිරි වුවවොත් එම ස්ථානය සකස් කිරීම සඳහා ලබා දිය හැකි බවත් ප්රරකාශ කරන ලදි.

**අශෝක කුමාර මහතා**

**පොල්වත්ත මහජන ක්‍රීසඩාංගනය සඳහා පොදු වැසිකිළියක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.**

**තීරණය - ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්‍රලදීප් මහතා**
**පොල්වත්ත මහජන ක්‍රීසඩාංගනය සඳහා පොදු වැසිකිළියක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුවක් ලබා ගන්නා ලෙස දන්වන ලදි.**

ආර්.එච්.ආර්.තාබ්රේ ච් මහතා
තමා භාරයේ ඇති වටිනා ක්‍රීආඩා භාණ්ඩ තබා ගැනීම සඳහා ස්ථානයක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කරන ලදි.
තීරණය - **ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්‍රනදීප් මහතා**

ක්‍රීයඩා මණ්ඩපයේ පිහිටා ඇති මෙයට පෙර අනුර ක්‍රීතඩා සමාජය සඳහා ලබා දී තිබූ කාමරය ලබා දීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දෙන ලදි.

සුගත් හෙට්ටි ආරච්චි මහතා
ක්‍රී්ඩා පිටිය වටා ඇති යකඩ වැට අළුත්වැඩියා කරන ලෙසට ඉල්ලීමක් කරන ලදි.
තීරණය - **ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්‍ර දීප් මහතා**

**යකඩ වැට අළුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තුවක් ලබා ගන්නා ලෙසට උපදෙස් ලබා දෙන ලදි.**

**ඉඳුනිල් එදිරිවික්‍රරමසූරිය මහතා**

**පාපන්දු ගෝල් ෆෝස්ට් දෙක සඳහා නෙට් දෙකක් ලබා දෙන ලෙසට ඉල්ලීමක් ඉදිරිපත් කර අතර ඒ සඳහා**

**තීරණය - ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා**

**මිල ගණන් කැඳවා එය ලබා දෙන ලෙසට උපදෙස් ලබා දෙන ලදි.**

**වෙනත් කරුණු**

එස්.කේ.පත්මසිරි මහතා

මාදම්පාගම පිහිනුම් තටාකයේ මැදට වයර් එකක් ඇද විදුලි ආලෝකය ලබා දෙන ලෙස ට ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදි.

තීරණය - **ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා**

**ඒ සඳහා තාක්ෂ ණ නිලධාරී වාර්තාවක් ලබා ගන්නා ලෙස උපදෙස් දුන් අතර විදුලිය අවම වශයෙන් පාවිච්චි කරන ලෙසට ඉල්ලීමක් කරන ලදි.**

**2017 ආසියා ක්‍රීඩා උළෙල හම්බන්තොටදී පැවැත්වෙන බැවින් ඒ සඳහා පාසල් ළමුන් සූදානම් කළ යුතු බවත් කියා සිටි අතර ක්‍රීරඩා නිලධාරීන්ගේ කැපවීම තිබේ නම් හොඳ ක්‍රීඒඩකයින් බිහිකර හැකි බව ප්‍රකාශ කරන ලදි.**

**ගරු ලේකම් තුමා**
අද දින කමිටුවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා තම වටිනා කාලය කැප කරමින් පැමිණ සිටි ක්‍රිඩා සමාජ , පාසල් නියෝජනය කරමින් පැමිණි නිලධාරින් හා නගර සභාවේ නිලධාරීන් ඇතුළු සියළුම මහත්ම මහත්මීන්ට ස්තූතිය පල කරමින් කමිටුවේ කටයුතු අවසන් කරන ලදි.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ කමිටුවෙදි ඩොල්ෆින් ජල ක්‍රීඩා සමාජයෙන් ඉල්ලීමක් කරල තියෙනවා වෙරළ උද්‍යානයේ ඇති ජීවිත ආරක්ෂක කබා ඒ අයට ලබා දෙන්න කියලා. දැනට වෙරළ උද්‍යානයේ තමයි ආරක්ෂක කබා. හිරේවත්ත පිහිණුම් ස්ථානය ආශ්‍රිතව ඒ කණ්ඩායම් සඳහා ආරක්ෂිත පද්ධතියක් ක්‍රියාත්මක කරන්න කියල ඉල්ලීමක් කරනවා මෙම ඩොල්ෆින් ජල ක්‍රීඩා සමාජයෙන්. ඒ නිසා කබා ටික හිරේවත්තෙ ඇඳුම් මාරුකරන ස්ථානයට ලබා දෙන්න කියල ඉල්ලීමක් කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

එතකොට සභාපතිතුමනි මෙතෙන්ට අවශ්‍යතාවක් වුනොත්.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔතන කබා තියල තිබුනෙ අපිත් USAID ආයතනයත් එකතුවෙලා ජීවිත ආරක්ෂක පුහුණුකරුවන් පුහුණු කරනු ලැබුවා. දැනට USAID ආයතනය අපට ආධාර දෙන්නෙ නෑ. නමුත් තාමත් සමහර වෙලාවට ඒ අය පුරුදු වෙනව එතන. ඒ කාර්යභාය දැනට කරන්නෙ ඩොල්ෆින් ජල ක්‍රීඩා සමාජයෙන් තමයි. මම හිතන්නෙ මේ ජැකට් ටික එතෙන්ට දුන්නට කිසිම ප්‍රශ්නයක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි ආරක්ෂක කබා මේ ජල ක්‍රීඩා සමාජයට ලබා දෙනවා සේම ඔබතුමා මැදිහත්වීමක් කරල හරි මොකද පහුගිය වකවානුවෙදි ජීවිත විශාල සංඛ්‍යාවක් නැතිවුනා ධීවරයින්ගෙ මේ සුළි කුණාටු තත්වයත් එක්ක. නමුත් තවමත් කුඩා ධීවර යාත්‍රාවල ධීවරයින්ට මෙම ආරක්ෂක කබා ලබා ගැනීමේ හැකියාව නැහැ. ධීවර අමාත්‍යාංශය හරහා හෝ ආරක්ෂක කබා ලබා ගැනීමට ඔබතුමාගේ දායකත්වය ලබා දෙන්න කියල ඉල්ලා සිටිනවා. බහුදින ධීවරයාත්‍රා සඳහා නැති වුනත් එක්දින ධීවර යාත්‍රා සඳහා පමණක්වත් ආරක්ෂක කබා දෙක බැගින්වත් ලබා දෙනවා නම් වඩාත් ප්‍රයෝජනවත් වෙනවා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ සම්බන්ධයෙන් මම ධීවර අමාත්‍යාංශයට සහ දකුණු පළාත් ධීවර අමාත්‍යාංශය සමග සාකච්ඡා කරල මේක ඉෂ්ඨ කරන්නම්. මගේ අදහසක් තිබුණ රෙඩ් ක්‍රොස් එකත් එක්ක එකතුවෙලා සියලු ධීවරයො සඳහා ප්‍රථමාධාර ක්‍රමවේදයන් පිළිබඳ පුහුණු සැසියක් පවත්වන්න. මොකද ධීවර අවස්ථාවෙදි යම් අයෙක් රෝගී තත්වෙකට පත් වුනොත් ගොඩට එනතුරු ප්‍රථමාධාර දිය යුතු ආකාරය පිළිබඳව දැනගත් යුතුයි. අපි නගර සභාව මගින් ඒ කාර්ය භාරය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒකත් එක්කම මේ ආරක්ෂිත කබා ලබා දීම සම්බන්ධයෙන් ක්‍රමවේදයක් බලන්නම්.

ඒවගේම මෙම වාර්තාවෙ තිබෙනවා ක්‍රීඩා පිටියෙ පිහිටි ක්‍රීඩා මණ්ඩපය වටා නව වැටක් ඉදිකරන්න කියලා. ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් සභාවෙන් ඉල්ලා සිටිනවා.

ඒවගේම පැසිපන්දු ක්‍රීඩාගාරයක් ලබා ගැනීමට හැකියාව තිබෙනවා. අපි ඒ සම්බන්ධයෙන් ඇස්තමේන්තු සකස් කරල ක්‍රීඩා අමාත්‍යාංශෙට යවමල තියෙනවා. එහිදී මම මේ පැසිපන්දු ක්‍රීඩාංගණය අම්බලන්ගොඩ හල්වතුර ක්‍රීඩාංගණයේ දැනට නිදහස් ප්‍රදේශයක් වශයෙන් ඉතුරු කරල ඇති ස්ථානයේ ඉදිකිරීමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි එතන පොදු කටයුතු සඳහා නේද තියෙන්නෙ. මේක හැදුවොත් ළමයින්ට සෙල්ලම් කරන්න තැනක් නැති වෙනව නේද. ඕකට ගමේ අය විරුද්ධ වෙයිද දන්නෙ නැහැ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගමේ අය කියන්නෙ හදන්න කියලා.

එම යෝජනාව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**ඒ අනුව 2013 -09-10 දින පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 5** **2013- 10- 29** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.

**පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව**

**2013.10.29 ප.ව. 2.30**

**සහභාගීත්වය**

- ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා සභාපති, අම්බලන්ගොඩ නගර සභාව.
- ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා. නගර සභා මන්ත්‍රී. අම්බලන්ගොඩ නගර සභාව
- ඩී වී සුනිල් මහතා ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව.
- ටී.එන් එල්.ඩී.එස් ගුණසේකර මහතා සෞ වෛ. නි. කාර්යාලය අම්බලන්ගොඩ,
- එච්.එච්.ඒ ද සිල්වා මහතා ඕකන්ද ග්‍රාම නිලධාරී
- පී. එච්. එල් සී පුෂ්පරාණි මහත්මිය සං සහකාර, අම්බලන්ගොඩ නගර සභාව,
- ඩී.එස්.ර්. ගමගේ මිය. ප.සෞ.සේ නිලධාරී
- පී. කුසුම් ද සිල්වා මිය කළමණාකරණ සහකාර
- එම්.ඩබ් හිරාන් සංජීව මහතා සෞඛ්‍ය පරිපාලක
- ඒ.ඒ.කේ රණවික්‍රම මහතා. සෞඛ්‍ය පරිපාලක

**පිළිගැනීම** :- **ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා.**

සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව සඳහා පැමිණි ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා, ඇතුළු අනෙකුත් සියලුම රජයේ නිලධාරී මහත්ම මහත්මීන් නගර සභා කාර්ය මණ්ඩලයත් ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව පවසන ලදි. ඉන් අනතුරුව එළඹියේ පසුගිය රැස්වීමේ සාකච්ඡා වු කරුණු සමාලෝචනයක යෙදීමයි.

**ගලි බවුසරයේ සේවය සඳහා නව සේවකයකු යොදවා ගැනීමට ඇති හැකියාව පිළිබඳ සොයා බැලීමට ගලි බවුසරය සඳහා වන ඉන්ධන ,ණය වාරිකය ,දිරි දීමනා,යනාදී වියදම් හා ආදායම් වාර්තාවක් මාසික සභාව සඳහා ඉදිරිපත් කිරීම.**

ගලි බවුසරයේ වියදම් වාර්තාවක් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබුණි.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**

මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා ගණකාධිකාරී මහතාගේ නිර්දේශය සහිතව මාසික සභාවට ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදි.

**පටබැඳිමුල්ල සායන මධ්‍යස්ථානයට යාබද ඉඩමේ පොල් ගස කපා ඉවත් කිරීම.**

පොල් ගස කපා ඉවත් කිරීම සඳහා අවසන් නිවේදනය යවා ඇති බව විෂය ලිපිකරු විසින් කමිටුව දැනුවත් කරන ලදි.

**තීරණය**
**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**
අවසන් නිවේදනය යවා දින 14ක් ඉකුත් වී ඇති බැවින් පොලිසිය සමග ගොස් වහාම ගස කපා ඉවත් කරන ලෙස දන්වන ලදි. මෙම කාර්‍ය නොවැම්බර් සභාවට පෙර ඉටු කළ යුතු බව අවධාරණය කරන ලදි.

**2013.10.31 දින පැවැත්වීමට නියමිත සුව කැදැල්ල වැඩසටහන පිළිබඳ සාකච්ඡා කිරීම.**

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපියේ සඳහන් අවශ්‍යතා ඉටු කර දෙන ලෙස උපදෙස් දෙන ලදි.

**පළාත් පාලන අමාත්‍යංශය මගින් එවා ඇති ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ලිපිය**

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යංශයේ ලේකම්ගේ අංක ජබර/15/10/ස්සරජමක්ර 2013ග10ග21 දිනැති ලිපියෙන් ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලෙස දන්වා තිබූ අතර ඊට අදාල වැඩසටහන් සකස් කරන ලෙස ද දැනුම් දී තිබුණි. ඒ පිළිබඳව පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/සං/02/06/01 හා 2013.10.28 දිනැති ලිපියද කමිටුවට ඉදිරිපත් කරන ලදි. සෞඛ්‍ය පරිපාලක මහතුන් දැනුවත් කර චක්‍රලේඛයට අදාළ වැඩ කොටස් ඉටුකර එම වාර්තා විෂය භාර නිලධාරියා වෙත භාර දෙන ලෙස උපදෙස් දෙන ලදි.

**අතිගරු ජනාධිපතිතුමාගේ ජන්ම දිනය හා දෙවන පදවි ප්‍රාප්තියට සමගාමීව ක්‍රියාත්මක කරනු ලබන දැයට සෙවණ ජාතික රුක් රෝපණ වැඩසටහන 2013 නිමිති කරගෙන නගර සභා ඉඩම්වල රුක් රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.**

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**
ඒ සඳහා සුදුසු වැඩසටහනක් සැලසුම් කරන ලෙසත්, රුක් රෝපණ වැඩසටහන්වලදී සිටවන පැල පිළිබඳ පසු විපරමක් සිදු කරන ලෙස ද උපදෙස් දෙන ලදි.

**වෙනත් කරුනු**
**ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා**
පින්නදූව වටරවුම පාර පළමු කොටස ජල තටාකයක් බවට පත් වී ඇති බැවින් එම ස්ථානයේ මාර්ගය උස්කර ගල් ස්ථරයක් යොදා මාර්ගයේ තාර දමාදෙන ලෙස ඉල්ලීමක් කරන ලදි.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**
එම මාර්ගයේ වැසි ජලය එකතුවීම වැලැක්වීම සඳහා ගත යුතු ක්‍රියා මාරග ඇතුළත් ඇස්තමේන්තුවක් වැඩ අධිකාරී මගින් ලබා ගෙන ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදි.

**වැඩ පරිපාලක එම්.ඩබ් හිරාන් සංජීව මහතා**
ඝ- 8796 අංක දරන මහේන්ද්‍රා ට්‍රැක්ටරයේ ඉදිරිපස රෝදයේ රිම් දෙක දිරාපත් වී ඇති බැවින් එය අලුත් වැඩියා කර දෙන ලෙස ඉල්ලීමක් කරන ලදි.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**

කඩිනමින් එම කාර්ය ඉටු කර දෙන ලෙස ලේකම් මහතාට උපදෙස් දෙන ලදි.

**ඕකන්ද ග්‍රාම නිලධාරි එච්.එච්.ජ් ද සිල්වා මහතා.**

තල්ගස්ගොඩ පොඩි පාළම අසළ අසල ඇළට හා ලොකු පාළම අසළ කසල දැම්ම නිසා දැඩි දුර්ලන්ධයක් හමන අතර බුද්ධදත්ත විද්‍යාලය අසල ද නැවතත් කසළ දැමීම සිදුවන බව පවසන ලදි.නැගෙනහිරු පදනම දැන්වීම් පුවරු සැකසීම සඳහා එකගත්වය එල කර තිබු බවත් පවසන ලදි.

තිරණය

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**

මෙම ප්‍රදේශයේ කසළ දැම්ම සම්පුර්ණයෙන් තහනම් යනුවෙන් දැන්වීම් පුවරු සකස් කර සවි කිරිම.

**ඕකන්ද ග්‍රාම නිළධාරි එච්.එච්.ජ්.ද සිල්වා මහතා**

කළුවඩුමුල්ල පඤ්ඤාලෝක පටුමග කන්දෙගොඩ හා සම්බන්ධවන මාර්ගයේ අවසන් කොටස ජලයෙන් යට විම නිසා එහි ගමන් කරන මගින් දැඩි අපහසුතාවන්ට පත් වන බව පවසන ලදි.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**

එම මාර්ගය සකස් කිරිමේ දී කාණු ඉදිකළ බවත් එම කාණු අවහිර විම නිසා මේ ආකාරයට ජලය පිරි පැවතිය හැකි බවත් මේ පිළිබඳව ඉතා කඩිනමින් සොයා බලා අවශ්‍ය පියවර ගන්නා ලෙස සෞඛ්‍ය උපපරිපාලක හිරාන් මහතාට හා රණවික්‍රම මහතාට උපදෙස් දෙන ලදි.

**ඕකන්ද ග්‍රාම නිළධාරි එච්.එච්.ජ්.ද සිල්වා මහතා**

පොල්වත්ත ආදාහනාගාරය ඉදිරිපිට විහාරගොඩ මාවතේ කොන්ක්‍රිට් ලෑලි කැඩී ඇති බවත් එම මාර්ගය ඉතා අබලන් තත්වයේ පවතින බවත් පවසන ලදි.

**තිරණය**
**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**

මෙම මාර්ගය කන්දෙගොඩ සිට කාපට් කර ඇති බැවින් බලප්‍රදේශ දෙක සම්බන්ධවන මෙවැනි මාර්ග වල ඉතිරි කොටස ද කාපට් කරන ලෙස ආණ්ඩුකාරතුමිය වෙත දැනුම් දී ඇති බවත් පවසන ලදි.

**ස්තුති කථාව**

**නගරසභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්නියගේ මහතා.**

අම්බලන්ගොඩ නගරයේ සෞඛ්‍ය කටයුතු සාර්ථකව ඉටු කිරිම සඳහා සභාපතිතුමා ගන්නා වු ප්‍රයත්නයට ස්තුතිය පුද කරමි. අද දින රැස්විම සඳහා පැමිණි සියලුම නිලධාරි මහත්ම මහත්මින්ට ස්තුතිය පුද කරන බව ප්‍රකාශ කරන ලදි.

ප.ව.4.15 ට පමණ රැස්විමේ කටයුතු නිම කරන ලදි.

**ඒ අනුව 2013 -10-29 දින පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනිපාරක්ෂක කම්ටු වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.**

**6: 7** **2013- 10- 23** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද සංවර්ධන උපදේශක කාරක සභා රැස්වීමේ වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>අම්බලන්ගොඩ නගර සභාව</u>**

**<u>සංවර්ධන උපදේශක කාරක සභා රැස්වීමේ වාර්තාව</u>**

දිනය - 2013.10.23 වේලාව - ප.ව. 2.30

ස්ථානය - නගර සභා රැස්වීම් ශාලාව

**<u>පැමිණීම</u>**

| | | |
|---|---|---|
| 1. | ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා | - නගර සභාව අම්බලන්ගොඩ |
| 2. | ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා | - නගර සභාව අම්බලන්ගොඩ |
| 3. | ගරු නගර සභා මන්ත්‍රී එච්.එල් අනුර කිත්සිරි මහතා | - නගර සභාව අම්බලන්ගොඩ |
| 4. | ඩී.වී. සුනිල් මහතා | - ලේකම්, නගර සභාව අම්බලන්ගොඩ |
| 5. | ඩී.ඩබ්. පත්මසිරි මහතා | - ගණකාධිකාරී |
| 6. | එම්. ඩබ්. සිසිර කුමාර මහතා | - කර්මාන්ත අධිකාරී |
| 7. | පී.එස්.පී. ද සිල්වා මහතා | - ම.සෞ. ප. |
| 8. | එම්.පී. ආර්. පුෂ්පකුමාර මහතා | - සංවර්ධන සහකාරල නගර සභාව අම්බලන්ගොඩ |
| 9. | එච්. ඩබ්. මහින්දසේන මහතා | - කමිටු සාමාජික |
| 10. | කමලසිරි වරුෂවිතාන මහතා | - කමිටු සාමාජික |
| 11. | පී.බඩ්. ගුණසිරි මහතා | - කමිටු සාමාජික |
| 12. | අනිල් කෝලිත මහතා | - කමිටු සාමාජික |
| 13. | බර්ට් රණසූරිය මහතා | - කමිටු සාමාජික |
| 14. | ඩී.ආර්..පී.ජයසේකර මිය | - කමිටු සාමාජික |

**ගරු සභාපති තුමා අද දින රැස්වීමට සහභාගී නොවූ බැවින් අම්බලන්ගොඩ නගර සභාවේ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා** විසින් පැමිණ සිටි සියළු දෙනා පිළිගනිමින් රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

2014 වර්ෂයේ අයවැය යෝජනා ලබා ගැනිමට සැම ග්‍රාමසේවා වසමකම රැස්වීමක් පවත්වා අදහස් ලබා ගැනිමට කටයුතු කරනු ලැබූ බවත්, එහි දී ලබා දුන් යොජනා මුද්‍රණය කර සැම කමිටු සාමාජිකයකුටම ලබා දුන් බවත් අද දින මෙම යෝජනාවන් ප්‍රමුඛතාවය අනුව පෙළ ගැස්වීමට බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කරන ලදි.යෝජනා අනුපිළිවෙලට සකස් කිරීමෙන් පසු සියලුම ප්‍රජා මණ්ඩල වෙත ඒ බැව් දැණුම් දෙන ලෙස ද දන්වා සිටින ලදි.

**නගර සභාවේ ලේකම් ඩී.වී. සුනිල් මහතා** අදහස් දක්වමින් අපි සියළු දෙනාගේම අදහස් ගම් මට්ටමින් ලබා ගෙන ප්‍රමුඛතාවය අරගෙන ක්‍රියා කිරීම සඳහා බලාපොරොත්තු වන බවත් අද දිනයේ අපගේ ඉල්ලීම පිළිගෙන පැමිණි කමිටු නියෝජිත මහත්ම මහත්මින්ට ස්තුතිවන්ත වන බවත් සැම දෙනාගේම අදහස් මෙහි දී ලබා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදි.

**කෙරමිණිය පින්නදූව ප්‍රජා කමිටු නියෝජිත ඩී.ආර්..පී.ජයසේකර මිය** විසින් අදහස් දක්වමින් කියා සිටියේ පෙර පැවති රැස්වීම් වලට සහභාගී වීමට නොහැකි වීම පිළිබඳව කණගාටු වන බවත් අද දින රැස්වීමේ කටයුතු පිළිබඳව නිරීක්ෂණය කිරීමේ දී මෙහි ඇති වැදගත්කම පැහැදිලි වන බවත්, ඉදිරි කමිටු වලට සහභාගී වන බවත්ය.

අනතුරුව එක් එක් කොට්ඨාශයේ කටයුතු පිලිබඳව එහිදි සාකච්ඡා කරන ලදි. ඒ අනුව පහත සඳහන් පරිදි යෝජනා ප්‍රමුඛතාවය පරිදි පෙළ ගැස්වීමට කටයුතු කරන ලද අතර එම ප්‍රමුඛතා ගත කරන ලද යෝජනා සඳහා **සංවර්ධන උපදේශක**

**කාරක සභාවේ නිර්දේශය ලබා දෙන ලදි.**

**ප්‍රජා මණ්ඩල පිහිටුවීම හා 2014 අයවැය යෝජනා ලබා ගැනීම**
**හෙප්පුමුල්ල ග්‍රාම නිලධාරි වසම**

| **ප්‍රමුඛතා අංකය** | **කර්මාන්තයේ නම** | **ඇස්තමේන්තු මුදල** |
|---|---|---|
| 1 | ආර්.ර්. ද සිල්වා මාවතේහි කාණු පද්ධතියෙහි වතුර පිරෙන බවත්, එම කාණු පද්ධතිය හා මාර්ගය පිළිසකර කිරීම. | 1,000,000.00 |
| 2 | මේධානන්ද මාවතට කාණු පද්ධතියක් ලබා දීම. | 500,000.00 |
| 3 | වර්ගනෙත්ති පාරේ සිට අතුරු මාර්ගය සංවර්ධනය කිරීම. | 500,000.00 |
| 4 | හෙප්පුමුල්ල පටු මග අවසාන කොටස මාර්ගය දීර්ඝ කිරීම. | 500,000.00 |
| 5 | ආර්.ර් ද සිල්වා මාවත අතුරු මාර්ගය සෑදීම. (ප්‍රතිසංස්කරණය) | 300,000.00 |
| 6 | නාමල් ඇල ජලයෙන් යටවන තත්වය මග හැරවීම. | 1000000.00 |
| 7 | කසල කළමනාකරණය නිවස තුල දීම සිදුකිරීම සඳහා අවශ්‍ය බඳුන් ඉල්ලා සිටීම. | 1,000,000.00 |
| 8 | කොහු කර්මාන්ත ශාලාව ලඟින් යන අතුරු මාර්ගය පළල් කිරීම. | 250,000.00 |
| 9 | හෙප්පුමුල්ල සේවා පියස වැඩ අවසන් කොට විවෘත කිරීම. | 500000.00 |
| 10 | රන්මුතු වෝල්ටර් මහතාගේ නිවස ඉදිරිපිට එකතු කරන ලද කසල නගර සභාව මගින් ගෙන යාමට කටයුතු කරන ලෙස ඉල්ලීම. | - |
| | | **5550000.00** |

## ප්‍රජා මණ්ඩල පිහිටුවීම හා 2014 අයවැය යෝජනා ලබා ගැනීම

## හිරේවත්ත ග්‍රාම නිලධාරි වසම

| ප්‍රමුඛතා අංකය | කර්මාන්තයේ නම | ඇස්තමේන්තු මුදල |
|---|---|---|
| 1 | ආර්.පී.ආතර් ද සිල්වා පාර කාණුව බැදීම (ඇස්තමේන්තු ඉදිරිපත් කර ඇත.) | 250,000.00 |
| 2 | මලන්වටුනෙන් එන වතුර මාර්ගය වෙනත් මාර්ගයකට හැරවීම හෝ මුහුදට හැරවීම. | 200,000.00 |
| 3 | අම්බලන්ගොඩ දුම්රිය පාර හා අලුත් පාර අසළ ඇති නිවාස වලට ජල බස්නාවක් සැකසීම. | 600,000.00 |
| 4 | නවෝද්‍යා පෙර පාසලට යන පාර නගර සභාවට පවරා ගෙන කොන්ක්‍රිට් කිරීම | 500,000.00 |
| 5 | මහවිදිය කාණු පද්ධති කොටස පවිත්‍ර කිරීම. | 200,000.00 |
| 6 | වරාය සඳහා ලබා දී ඇති බිගන් පහන නිසි පරිදි ස්ථාන ගත කිරීම. | 200000.00 |
| 7 | බෝක්කු වැට හා ගග දක්වා ඇති පාර සකස් කිරීම (ඉදිකිරීම් අවසන්) | |
| 8 | ප්‍රජා ශාලාව අසළ පාර සංවර්ධනය කිරීම (වැඩ අවසන්) | |
| | | **1950000.00** |

**ප්‍රජා මණ්ඩල පිහිටුවීම හා 2014 අයවැය යෝජනා ලබා ගැනීම**
**කළුවඩුමුල්ල ග්‍රාම නිලධාරි වසම**

| ප්‍රමුඛතා අංකය | කර්මාන්තයේ නම | ඇස්තමේන්තු මුදල |
|---|---|---|
**11:1** " Unplugged සංගීත ප්‍රසංගයේ වෙනුවෙන් දක්වන ලද සහයෝගයට ස්තුතිය පුද කිරීම " මැයෙන් ධර්මාශෝක විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

කණිෂ්ඨ ආදි ශිෂ්‍ය සංගමය විසින් අරමුදල් තර කර ගැනීම පිණිස පවත්වන ලද Unplugged සංගීත ප්‍රසංගය වෙනුවෙන් විනෝද බදු මුදල් නිදහස් කර දීම, නොමිලයේ ප්‍රචාරණ පුවරු ප්‍රදර්ශනය සඳහා අවස්ථාව ලබා දීම තුලින් නගර සභාවේ ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රී මඩුල්ල ලබා දුන් සහයෝගයට ස්තුතිය පුද කරන බව දන්වා තිබුණි.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි මේකෙ විනෝද බදු නිදහස් කිරීම කරල තියෙන්නෙ. ඒකට සභාවෙන් ලියුමක් යවනවද?

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේකෙ විනෝද බදු නිදහස් කරල තියෙන්නෙ.

**තීරණය**

☛ **මෙම ලිපිය සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**11:2** “ අම්බලන්ගොඩ බස් නැවතුම් පොල පොදු වැසිකිළිය බදු දීම ” මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

බස් නැවතුම්පොල පොදු වැසිකිළිය බදු දී ඇති කාලය 2013- 12- 31 දිනෙන් අවසන් වන බවත් දැනට මාසික බදු කුලිය රු. 7200/- ක් බවත් 2014 වර්ෂය සඳහා පොදු වැසිකිළිය බදු දීමට ටෙන්ඩර් කැඳවීමට සභා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**තීරණය**

☛ **බස් නැවතුම්පොල පොදු වැසිකිළිය 2014 වර්ෂය සඳහා බදු දීමට ටෙන්ඩර් කැඳවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:3** “ අන්තර් දහම් පාඨශාලයීය රචනා තරගයේ ත්‍යාග ප්‍රදානෝත්සවය හා උපහාර උත්සවය පැවැත්වීම සඳහා නගර ශාලාව ලබා ගැනීම සම්බන්ධයෙනි ” මැයෙන් අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමයේ ලේකම්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

තරුණ බෞද්ධ සංගමය වාර්ෂිකව සංවිධානය කරනු ලබන රචනා තරගයේ සහ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනේ ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා 2013 - 12 - 29 දින ප. ව. 2.00 සිට 6.00 දක්වා නගර ශාලාව මුදල් අය කිරීමකින් තොරව ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

**තීරණය**

☛ **ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා 2013 - 12 - 29 දින ප. ව. 2.00 සිට 6.00 දක්වා විදුලිය සහ ජලය සඳහා ගාස්තු අයකර නගර ශාලාව මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:4** “ ස්තුතිය පුද කිරීම” මැයෙන් අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමිය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අප කාර්යාලය විසින් කරන ලද ඉල්ලීමකට අනුව සායන සහ කාර්යාල කටයුතු සඳහා අඩුපාඩුවක්ව පැවති භාණ්ඩ ලබා දීම වෙනුවෙන් තමා ඇතුලු කාරය මණ්ඩලයේ ස්තුතිය පුද කරන බව දන්වා තිබුණි.

__තීරණය__

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**11:5** “ අම්බලන්ගොඩ බස් නැවතුමේ සිට ක්‍රියාත්මක වන මහ අම්බලන්ගොඩ හා දූව ප්‍රදේශය දක්වා ක්‍රියාත්මක චක්‍රිය බස් සේවාව සම්බන්ධවයි ” මැයෙන් ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා විසින් ඉදිරිපත්කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ඉහත සඳහන් මාර්ගයේ ආරම්භ කරන ලද බස් සේවාව දැනට මාස තුනක පමණ කාලයක සිට අඩාලව ඇති බවත් මෙම මාර්ගයේ ගමනා ගමන කටයුතු සඳහා විශාල පිරිසක් සිටියද නිසි පරිදි කාල සටහනකට අනුව ක්‍රියාත්මක නොවීම නිසා එය අඩාල වී ඇති බවත් මෙම චක්‍රිය බස් සේවාව නැවතත් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කරන ලෙසත් ඉල්ලා තිබුණි.

__ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්__

සභාපතිතුමනි පසුගිය මාර්තු මාසයේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙ ප්‍රදානත්වයෙන් මේ බස් සේවාව ආරම්භ කරා. එහිදී පාසල් යන දුවා දරුවන්ට සහ ප්‍රදේශවාසීන්ට ඉතා පහසු වන ආකාරයෙන් පැවති මේ බස් සේවාව බස් හිමියා විසින් එතුමාගේ අවශ්‍යතා පරිදි සහ රියදුරාගේ අවශ්‍යතා පරිදි බස් සේවාවේ මාර්ගය වෙනස් කරනවා. මෙහිදී මේ සේවාව ලබාගත් අය අපහසුතාවයට පත් වෙනවා. මේ සම්බන්ධව බස් හිමියා සහ රියදුරා දැනුවත් කරා. ඒකට ඇහුන්කම් දෙන්නැති තත්වයක් තුල අපි දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවයටයි ගරු ප්‍රධාන අමාත්‍යතුමාටයි ඒ සම්බන්ධව දැනුම් දීම් කරා. ඒ ගත් ක්‍රියාමාර්ගයන් නෛතික තත්වයෙන ක්‍රියා කරන්න කියා ඉල්ලා සිටිනවා. අනිත් කාරණය තමයි දූව, පනියන්දූව ආශ්‍රිත දුවා දරුවන් කුලරත්න විද්‍යාලයට සහ බුද්ධදත්ත විද්‍යාලය දක්වා යාමේදී මගී වැන් රථ වලින් ගමන් කිරීම පාසල අසලටම සිදුවන අතර දෙමාපියන් බලාපොරොත්තු වෙනව ඒ ආරක්ෂාව සහ පහසුකම පාසල ආසන්නයටම ලැබෙයි කියලා. බස් හිමියන් සහ රියදුරන් එකතුව ඒ දරුවන් හල්වතුර මංසන්ධියෙන් බස්සල කුලරත්න පාරෙන් නැවතත් ප්‍රධාන බස් නැවතුම දක්වා ඒමේදී බස් රථයෙන් ගමන්ගත් දුර හා සමාන දුරක්ම පයින් නැවත ගමන් කිරීමට සිද්ධ වෙනවා. එහෙම තත්වයක උනත් පාසල් යන දරුවන් අසීමිත පිරිසක් හිටියා. එහෙම ඉඳලත් පෝරඹ මංසන්ධියටවත් යන්නෙ නෑ. දෙමාපියන් කියන්නෙ බස් ගාස්තුව දෙගුණයක් වුනත් කමක් නැහැ පාසල ළඟටම යනව නම් කියලා. ඒ නිසා අවශ්‍ය ආයතන දැනුවත් කරල මේ සඳහා යම් ක්‍රියාමාර්ගයක් ගන්න කියල ඉල්ලා සිටිමින් නිහඩ වෙනවා.

__ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

මේ පිළිබඳව මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවයෙන් ඉල්ලීමක් කරන්න මෙම බස් සේවාව විධිමත්ව පවත්වාගෙන යන්න කටයුතු කරන්න කියලා.

__තීරණය__

☞ **මෙම බස් රථ සේවාව විධිමත් කොට ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් සහ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවයේ සභාපතිතුමාගෙන් ඉල්ලීම් කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:6** " නොමිලයේ අභ්‍යාස පොත් බෙදා දීම 2013 " මැයෙන් ප්‍රජා සංවර්ධන නිලධාරී මිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014 වර්ෂය සඳහා නගර සභා බල ප්‍රදේශය තුල පදිංචි අඩු ආදායම් දරුවන් 3500 ක් සඳහා නොමිලයේ අභ්‍යස පොත් බෙදා දීම සඳහා වන ඇස්තමේන්තුව රු. 1500000.00 ක් බවත් ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**<u>ඇස්තමේන්තු මුදල</u>**

| | | |
|---|---|---|
| පොත් හා ලිපි ද්‍රව්‍ය සඳහා වන වියදම | - | **1200000.00** |
| වේදිකාව ,සැරසිලි,ප්‍රචාරණ වියදම | - | **150000.00** |
| උත්සව දින වියදම, සංග්‍රහ හා අනෙකුත් වියදම් | - | **<u>150000.00</u>** |
| **ඇස්තමේන්තු මුළු මුදල** | - | **<u>1500000.00</u>** |

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි පොත් බෙදා දීම හොඳයි. උත්සව වියදම් වලට ලක්ෂ තුනක් වගේ ගානක් දරනවට අපි විරුද්ධයි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙතරම් මුදලක් වියදම් වෙන්නෙ නැහැ. මීට වඩා අඩු මුදලක් තමයි වියදම් වෙන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්</u>**

අඩු මුදලක් වුනත් සභාපතිතුමනි අපේ ප්‍රජා සංවර්ධන කමිටු වලදී ගණකාධිකාරීතුමාට කිව්ව විග්‍රහයක් කරන්න කියල මුදල් තත්වය. එතුමා කිව්ව අපිට ස්ථිර නැති සේවකයන්ගෙ පඩි ගෙවන කොට ලක්ෂ 8 ක් අනිවාර්යෙන් තියෙන්න ඕනෙ කියලා. සභාවෙ මුදල් අර්බුදයක් නැතෙයි කියන්න බැහැ. මෙතනදී පොත් දීම නෙමෙයි ප්‍රශ්නෙ තියෙන්නෙ උත්සවයට ලොකු ගානක් වියදම් කරනවට අපි විරුද්ධයි. පොත් දෙන එකට අපි කැමතියි. නගර ශාලාව අරගෙන මෙතන කරනව නම් වෙන වියදමක් නැහැ. අපි පොත් දුන්නෙ පාසල් වලට ගිහිල්ල. දැන් පොත් දෙන එක තරගයක් වෙලා. අපේ පැත්තෙ අපට ඉස්සෙල්ල ඉල්ලුම්පත්‍ර බෙදල. ජනතාව මට කිව්ව ජයන්ත අයියෙ වෙනද අපට කොල දෙන්නෙ ජයන්ත අයිය නේද? මේ සැරේ අතුල ඇවිල්ල කොල දුන්නයි කියලා. ඔබතුමා මන්ත්‍රීවරුන් දොළොස්දෙනාට එක දවසක ඕනෙ මේව දෙන්න.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සියලු මන්ත්‍රීවරුන්ට ඉල්ලුම්පත් දෙන්න තිබුනෙ අද. සමහර මන්ත්‍රීවරු ඇවිල්ල කලින් අරගෙන ගිහිල්ල.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අතුල මහත්තය කොහොමද මට ඉස්සෙල්ල ගිහිල්ල කොල දුන්නෙ. අතුල මහත්තය කවුද මේකෙ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අතුල මහත්තය කාගෙන්හරි ඉල්ලගන්න ඇති.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්</u>**

ඔබතුමාගෙන්ම තමයි ඉල්ලන් ගිහිල්ල තියෙන්නෙ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ස්ථාන හතරක එහෙම දීල තියෙනවා. ප්‍රජා සංවර්ධන කමිටුවට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්</u>**

තමුන්නාන්සෙ මේව සාධාරණව කරන්න. තමුන්නාන්සෙ පළාත් සභාව දිහා බලාගෙන තමයි වැඩ කරන්නෙ . තමුන්නාන්සෙ ලෝක ළමා දිනයෙදිත් කරේ වෙනත් ප්‍රදේශ වලින්නු ගෙන්නල. අර ලක්බිම පත්තරේ දාල තිබුනෙ. මොන සභාවෙන්ද තමුන්ගෙ බල ප්‍රදේශෙ හැර වෙනත් බලප්‍රදේශයකින් ගෙන්නල උත්සව තිබ්බෙ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මම මගේ පුතා පොඩි කාලෙ කොළඹ එක්කන් ගියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්</u>**

කොළඹ කරන්න පුලුවන්. අපට බලයක් දීල තියෙන්නෙ බල ප්‍රදේශය තුල වියදම් කරන්න තමයි. අපි මේ උත්සව වියදම් වලට විරුද්ධයි. ඒකෙන් අපේ පාරවල් ටික හදල දෙන්නකො. බදු ගෙවන ජනතාවට කියනවා ඇවිල්ල බදු ගෙවන්නයි කියලා. සමහර වෙලාවට අපේ නිලධාරීන් එක එක තැනට දාල බදු එකතු කරනවා. ඒ බදු වලින් ඉස්සෙල්ලම කාණු සුද්ධ කරන්න ඕනෙ. සමහර තැන්වල පාර දෙපැත්ත සුද්ධ වෙලා නැහැ. සමහර පාරවල් කෙරෙනවා. අපේ විලේගොඩ පාර, ධම්මානන්ද පාර ඒව කෙරෙන්නෙ නෑ. තමුන්නාන්සෙ පයින් ගිහිල්ල බලන්න මහ පන්සල පාරෙ, ධම්මානන්ද පාරෙ මොකක්ද කියල තත්වෙ. අපි කියන්නෙ ආදායමට සරිලන විදියට ඕනෙ නගර සභාව පාලනය කරන්න. මම දන්නව එදා ඉඳල නගර සභාවෙ ආදායම් වියදම් තත්වෙ. අපි දැනගන්න ඕනෙ අපට මුලින්ම තියෙන්නෙ සෞඛ්‍ය. ඊළඟට මාර්ග. සමහරු කියනවා කණු ගලවල නැහැ කියලා පාරෙ. ඉඩම් හිමයන් ඉඩම් පරිත්‍යාග කරල තියෙනවා. නමුත් නාම බැරිවෙලා තියෙනවා ඒ පුලුල් කරපු තැන්වල පාර පළල් කර ගන්න. මම කියන්නෙ ජනතාව ගෙවන බදු නියම විදියට පාවිච්චි කරල මහජනතාවට තියෙන පීඩාවල් අඩු කරල අනිත් වැඩ කරාට අපිට ප්‍රශ්නයක් නැහැ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මම කියන්න ඕනෙ මේ අවුරුද්දෙ වැඩිම මුදලක් දීල තියෙන්නෙ විපක්ෂ නායකතුමාගෙ කොට්ඨාශෙට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි අපේ විපක්ෂ නායකතුමා ප්‍රකාශ කරපු දේවල් සම්බන්ධයෙන් කියන්න ඕනෙ මෙතුමාලගේ කාලෙදි වියදම් කරාට වඩා විශාල මුදලක් අපි මහජනතාව වෙනුවෙන් දරනවා. මෙහිදී අපි 3500 කට පොත් බෙදා දෙන තත්වයක් තුල ඒ තුලින් දේශපාලන වශයෙන් යම් ප්‍රතිරූපයක් ගොඩනගා ගැනීම ඒක ඉබේම සිද්ධ වෙන දෙයක් සභාපතිතුමනි. ඒ දේවල් දෙස අපි පෘතග්ජන පුද්ගලයෝ හැටියට උපේක්ෂාවෙන් බලන්න ඕනෙ. ඊර්ෂ්‍යා කරන්නෙ නැතුව. ජයන්ත මහතා කියූ ආකාරයට ඔබතුමාට දිස්ත්‍රික්කයේ නායකත්වයට යෑමට අවස්ථාව තියෙන වෙලාවක අපි ඒ ගැන සන්තෝෂ විය යුතුයි. දරුවන් 3500 කට අභ්‍යාස පොත් දීම තුලම ලංකාවෙ තියෙන පළාත් පාලන ආයතනයක් විදියට කුඩා නගරයක් තුල අපි දැවැන්ත ව්‍යාපෘතියක් කරන්නෙ. ඔබතුමා මීට වඩා විශාල ඇස්තමේන්තුවල උත්සව කරා. එහිදී සභාවේ සහ අයබදු ගෙවන්නන්ගේ මුදල් ඒ සඳහා වැය වුනේම නැහැ. මෙම උත්සවයේදීත් නගර සභාවෙන් දරන වියදම අවම කර ගැනීමට ඔබතුමා දැනටමත් කටයුතු කරන බව අපි දන්නවා. අපි කණ්ඩායමක් හැටියට ඒ සම්බන්ධ තීරණ දැනටත් හරගෙන කියල මම සතුටින් කියන්න කැමතියි. ඊට අමතරව අම්බලන්ගොඩ නගර සභාවෙ සහ සියලු පළාත් පාලන ආයතන තුල කම්කරු කණ්ඩායම් ඉන්නෙ නිරන්තරයෙන් වැඩ කරන්න තමයි. අපේ විපක්ෂනායකතුමාට ආණ්ඩුපක්ෂයේ මන්ත්‍රීවරුන්ට වඩා වැඩි ප්‍රතිපාදන ලබා දීල තියෙනවා. අපිට හිතට අමාරු දැවැන්ත සංවර්ධන කටයුතු කරලත් ඒ දේවල් වල ඇගයීමක් නැති එක සම්බන්ධව. පොත් බෙදා දීම සම්බන්ධයෙන් අපි ඉල්ලා සිටිනවා එම උත්සවය මහජන ක්‍රීඩාංගණයේ පවත්වන්න කියාත් නගර ක්‍රීඩා සඳහා ත්‍යාග ප්‍රධානෝත්සවය වෙනත් මුහුණුවරකින් පවත්වන්න කියාත්. උත්සව කිහිපයක වියදමක් තමයි මෙතන මේ තියෙන්නෙ. දේශපාලන නායකයින් සහභාගී වන මෙම උත්සවය ඉතා සංවිධානාත්මකව කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

නගර ක්‍රීඩා වල තෑගි ලබන අය විතරක් ඉන්නව 700 ක් විතර. මෙතන 3500 යි. 4200 ක් දාන්න හෝල එකක් අම්බලන්ගොඩ නෑ. ඒ නිසා මේකට ඉදිකිරීමක් කරන්න වෙනවා. ළමයි අව්වෙ තියන්නත් බෑ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි අම්බලන්ගොඩ නගර සභාව විසින් ප්‍රදේශයේ දරුවන්ට අභ්‍යාස පොත් නොමිලයේ ලබා දීම සම්බන්ධව මම හදවතින්ම සුභ පතනවා. නමුත් මේ සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගෙ තත්වය කෙලෙසීම පිළිබඳව මම ඔබතුමාට සහ නිලධාරී මණ්ඩලයට මේ වෙලාවෙ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. මේ සභාව නියෝජනය කරන මන්ත්‍රීවරු 12 දෙනාම ඔබතුමාට එක හා සමාන විය යුතුයි. ඔබතුමාගෙ දේශපාලන මතිමතාන්තර ඉටුකර ගැනීම වෙනම කතාවක්. මන්ත්‍රීවරුන්ගෙ ගෞරවය ආරක්ෂා කිරීමට ඔබතුමා බැදිල ඉන්නවා. මේ පොත් බෙදා දීමේ ව්‍යාපෘතියෙදි ඔබතුමා කිව්ව එක් මන්ත්‍රීවරයෙකුට ෆෝම් 150 ක් දෙනව කියලා. නමුත් අපිට 100 යි ලැබිල තියෙන්නෙ.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

100 නෙමෙයි 150 ක් වෙන්න ඕනෙ. ඉතුරු ටික එවන්නම්.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි ඔක්තෝම්බර් මාසෙ 25 වෙනිදා තමයි මේ අයදුම්පත්‍ර ගෙවල් වලට ලබා දීම සිදු කෙරුනෙ පෝරඹ සහ පටබැඳිමුල්ල ප්‍රදේශවල. ඊට පස්සෙ 28 වෙනිදා සඳුදා තමයි සභා වාර්තා සමග අයදුම්පත් ලබා දුන්නෙ. නමුත් විපක්ෂයේ මන්ත්‍රීවරු හතර දෙනාට ඒක ලැබුනෙත් නැහැ. මම මෙතෙන්ට ඇවිල්ල කෑ ගැහුවහම තමයි ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය කම්ටු වාර්තා එක්ක එව්වෙ.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මන්ත්‍රීතුමා මේ ෆෝම් දෙන්න හිටියෙ අද. මන්ත්‍රීවරු සභාවට ආවම ෆෝම් තියෙනවයි කිව්වම අරගෙන ගියා.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි මේ මන්ත්‍රීවරුන්ගෙ ගෞරවය ආරක්ෂා වෙන විදියට වැඩ කරන්න ඔබතුමා බැඳිල ඉන්නවා. අපි ජීවත්වන ප්‍රදේශයේ අපට මුහුණ දෙන්න බැහැ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සමහර වෙලාවට විපක්ෂ මන්ත්‍රීවරුන් නියෝජනය කරන කොට්ඨාශ වලදි අපේ පක්ෂයේ සමිති සමාගම් තියෙන වෙලාවෙදි ඒව දෙන්නෙ නැහැයි කියල චෝදනාවක් එල්ල කරා. මම කල්පනා කරා ඒ අවස්ථාවෙදි අපි ප්‍රජා කමිටු පිහිටෙව්වා. ඒ ප්‍රජා කමිටු වල කොට්ඨාශ හතරක සභාපතිවරුන්ට විලේගොඩ, පෝරඹ, පොල්වත්ත, හෙප්පුමුල්ල කියන ප්‍රජා කමිටුවල සබාපතිවරුන්ට දුන්න ඒ ග්‍රාම සේවක කොට්ඨාශෙ බෙදන කොටස.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි මම කියන්නෙ ඔබතුමාලගේ බෙදීම සම්බන්ධව නෙමෙයි. මේ මන්ත්‍රීවරුන්ගෙ ගෞරවය ආරක්ෂා කරන්න කියල මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ කාරණයෙදි පොදුවෙ අපිත් අත උස්සල තියෙනවා. මේකට කවුරුවත් විරුද්ධ වුනේ නෑ. ඒ ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය සම්බන්ධයෙන් මම කණගාටුව ප්‍රකාශ කරනවා මේ අවස්ථාවෙදි පටු දේශපාලන අදහස් ඔලුවෙ තියාගෙන වැඩ කිරීම සම්බන්ධව.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ සම්බන්ධව කිසිම කෙනෙකුට දොස් කියන්න එපා. ඒ වගකීම මම බාර ගන්නවා. අපේ පාලක පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙ සෑහෙන උනන්දුවක් තියෙනවා. ඒ අය ඇවිල්ල අරගෙන ගියා.

**ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**

දෙසැම්බර් මාසෙ කිට්ටුවෙන කොට අපි දන්නව මෙම සහනය මෙම නගර සභාවෙන් ලැබෙනව කියලා. ඒ නිසා අපි නොවැම්බර් මැද වන විට ඉදලම උනන්දුවෙන් තමයි ඉන්නෙ. මෙතුමන්ලගේ එවැනි උනන්දුවක් ඇති බවක් පේන්නෙ නැහැ. ඒ නිසා තමයි මෙහෙම වුනේ. මම හිතන්නෙ ඔබතුමාගෙ වරදක් විනා අපේ නිලධාරීන්ගෙ හෝ සභාපතිවරයාගේ වරදක් නෙමෙයි මේක.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

සභාපතිතුමනි අභ්‍යස පොත් බෙදා දීමේදී විපක්ෂ මන්ත්‍රීවරුන්ට වුන අසාධාරණය නිසා තමයි මේ කෑ ගහන්නෙ. න්‍යාය පත්‍රය බෙදල දවස් පහකට පස්සෙ තමයි අපට ෆෝම් කොල ආවෙ. මගෙන් කීප දෙනෙක් ඇහුව. මම කිව්ව අපට මේ සැරේ දෙන්නෙ නැතුව ඇති කියලා. අපිට හම්බ නොවුනට ගමේ බෙදනව. මේ පොත් බෙදා දීම ආරම්භ කරේ අපි. අපිට ගියේ රු. ලක්ෂයට අඩු ගානක්. පාසල් වල විදුහල්පතිවරු මගින් තමයි අඩු ආදායම් අය තෝරල දෙන්නෙ. පී. එම්. එස්. මහත්මය එතුමාගෙ කැබ් රථයෙන් පොත් ටික ගෙනිහිල්ල තමයි පොත් ටික දුන්නෙ. අපිට එදා වියදම් ගියේ නැහැ. එදා ලක්ෂයෙන් කරපු වැඩේට අද ලක්ෂ දහයක් යනවා. ඒක හරි. මම කියන්නෙ අපි මන්ත්‍රීවරු හැල්ලුවට ලක් කරන්න එපා කියලා. න්‍යාය පත්‍රයත් එක්ක 150 ක් දෙනව නම් අපිටත් ඒක දෙන්න. අපේ ගමෙත් මාත් එක්ක විරුද්ධව ඡන්දෙ ඉල්ලපු ධනසේන මාදුවගේ මහත්මය කොල බෙදල තියෙනවා. දේශපාලනය කරන කොට ගමේ මිනිස්සු පුද්ගලයෝ කවුද කියන එක හඳුනගෙන ඉන්නෙ. මෙතනදි ඔබතුමා වගකීම භාර ගත්තා මේ සම්බන්ධව. ඒක හරි. ඔබතුමා තමයි කියල තියෙන්නෙ

විපක්ෂයේ මන්ත්‍රීවරු හතර දෙනාට බෙදා ගන්න බැරි වෙන්න බෙදන්න කියල. අපේ ෆෝම් 150 ම අපේ ගෙවල් ඇතුලෙ තියෙනවා. මේ පොත් දෙන එකට අපි කැමතියි. ඔබතුමා මේක දිගටම කරගෙන යාම සම්බන්ධව අපි සතුටු වෙනවා. අපි කතා කරන්නෙ අපිට කරපු මේ අසාධාරණය සම්බන්ධව.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මම උපදෙස් දුන්නෙ 150 ගානෙ බෙදන්න. අඩුවක් වෙලා තියෙනව නම් අද හවසම ඒ ටික එවන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

සභාපතිතුමනි පොත් බෙදාදීමේ කාර්ය වාර්ෂිකව පවත්වනව ඉතාමත්ම හොඳින්. එක්සත් ජාතික පක්ෂය කරපු ක්‍රම වේදයම අපි කරන්න ඕනෙ කියල එකක් නැහැනෙ. වියදම අඩුකර ගැනීමේ හැකියාව ඔබතුමාට තියෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි අතීතයට වර්තමානය සම කිරීම කණගාටුදායකයි. අතීතයේ ළමුන් කීප දෙනෙකුට පොත් ලබා දීමත් අද දින ළමුන් 3000 කට 3500 කට පමණ පොත් ලබා දීමත් අතර ලොකු වෙනසක් තියෙනවා. ගිය සැරේ මට මතකයි ධාරා නිපාත වර්ෂාව. ඔබතුමා ඒ ටෙන්ට් එක නොගහන්න ළමයි තෙමිල විශාල විනාශයක් වෙනවා. ඔබතුමාගෙ වැඩ පිළිවෙල ජනතාව අනුමත කරන නිසා තමයි ඔබතුමා ඔය පුටුවෙ ඉන්නෙ. නගරයේ ළමයින්ට දුප්පත් පොහොසත් කියල නැහැ නගරයේ ළමයි සියල්ලන්ටම වගේ මේ මගින් පොත් පත් බෙදිල යනවා. ඔබතුමා සභාපතිවරයා වශයෙන් මේ මන්ත්‍රීවරුන්ට සියලු දෙනාට එක සමාන ප්‍රමාණයක් බෙදල දීල තියෙනවා. මෙතන තියෙන්නෙ ඉස්සෙල්ල බෙදා ගැනීමට බැරි වුන ප්‍රශ්නයක්. මෙතන තියෙන්නෙ ප්‍රායෝගික ප්‍රශ්නයක්. බෙදා ගැනීම පිළිබඳ පොඩි ප්‍රශ්නයක් තියෙන්නෙ. ඒක සහයෝගයෙන් කරගමු කියල ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි දීර්ඝව සාකච්ඡා කල මාතෘකාවක්. සභාපතිතුමනි අපි ආණ්ඩු පක්ෂෙ. මෙතුමන්ල විපක්ෂෙ. මේකෙ පොඩි වෙනසක් තියෙනවා. නමුත් සභාපතිතුමා ඒකෙ වෙනසක් කරල නැහැ. 150 ගානෙම දීල. හරියට බැලුවොත් සභාපතිතුමනි අපි ඕනෙ කෑ ගහන්න. මමත් රාහුල මන්ත්‍රීතුමත් ග්‍රේෂන් මන්ත්‍රීතුමත් ජගත් කුමාර මන්ත්‍රීතුමත් ඕනෙ මේකට විරුද්ධ වෙන්න. මොකද අපි හතර දෙනාට තමයි 150 ගානෙ උනේ. ජයන්ත මහත්මයට 150 යි. ප්‍රජා කමිටුවෙන් බෙදනව 100 ක් එතකොට විලේගොඩට 250 යි. මහ අම්බලන්ගොඩට 450 යි. දේව් මන්ත්‍රීතුමාට 150 යි ප්‍රජා කමිටුවට 100 යි එතකොට 250 යි. ජනිත් මන්ත්‍රීතුමාට 150 යි ප්‍රජා කමිටුවට 100 යි එතකොට 250 යි. සභාපතිතුමා මට තමයි කොට්ඨාශෙත් ලොකුවටම තියෙන්නෙත්. සභාපතිතුමනි මම කියන්න ඕනෙ අම්බලන්ගොඩ නගර සභාව එක්සත් ජාතික පක්ෂයේ තිබ්ල අපි ගත්තෙ අමාරුවෙන්. 97 අපි යාන්තම් ඇවිල්ල අද මන්ත්‍රීවරු 8 දෙනෙක් ඉන්නවා. මම කියන්නෙ මේ වැඩ සටහන සාර්ථකව ඉටු කරන්න කියලා. ඒවගේම සභාපතිතුමනි මම ඉල්ලා සිටිනවා සුනාමියෙන් අවතැන් වුන ළමයි රතු කුරුස නිවාස වල ජීවත් වෙනවා. ළමයි 40 ක් විතර ඉන්නවා. පුලුවන්නම් ඒ අයටත් ලබා දෙන්න කටයුතු කරන්න. ඒ අය අම්බලන්ගොඩ ජීවත් වුන අය.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

රතු කුරුස අයට දෙනව නම් යෝජනාවක් සම්මත කර ගන්න ඕනෙ. කොට්ඨාශෙන් පිට නිසා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මම යෝජනා කරනවා සභාපතිතුමනි රතු කුරුස අයට පොත් ලබා දීම සිදු කරන්න කියලා. ඒ එක්කම සභාපතිතුමනි මගේ කොට්ඨාශය විශාල කොට්ඨාශයක්. ඒ නිසා වැඩිපුර ඉල්ලුම්පත් ප්‍රමාණයක් ලබා දෙන්න කියලත් මම ඉල්ලා සිටිනවා.

<u>තීරණය</u>

☞ **නගර සභා බල ප්‍රදේශය තුල පදිංචි අඩු ආදායම් දරුවන් 3500 ක් වෙනුවෙන් නොමිලයේ අභ්‍යාස පොත් බෙදා දීම සඳහා වන රු. 1500000.00 ක් වූ ඇස්තමේන්තුව සඳහා ඡන්දය විමසනු ලදුව පක්ෂව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා, ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂමී හේමන්තා මෙනවිය, ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා, ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා , ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා යන අය ඡන්දය ප්‍රකාශ කල අතර ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:7** " අම්බලන්ගොඩ ධීවර සංකීර්ණ ගොඩනැගිල්ල 2013-12-27 සහ 28 යන දින දෙක ප්‍රදර්ශනය සහ පොල සඳහා වෙන් කර ගැනීම " මැයෙන් උද්‍යාන විද්‍යා හා මල් වවන්නන්ගේ සංගමයේ (II කණ්ඩායම) සභාපතිතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

උද්‍යාන විද්‍යා හා මල් වවන්නන්ගේ සංගමයේ (II කණ්ඩායම) වාර්ෂික ප්‍රදර්ශනය සහ පොල පැවිත්වීම සඳහා 2013- 12- 27 සහ 28 දෙදින ධීවර සංකීර්ණ ශාලාව සහනදායී මිලකට ලබා දෙන ලෙසත ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **වාර්ෂික ප්‍රදර්ශනය සහ පොල පැවිත්වීම සඳහා 2013- 12- 27 සහ 28 දෙදින ධීවර සංකීර්ණ ශාලාව පසුගියවර ලබා දුන් සහනය යටතේම ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:8** " අතිගරු ජනාධිපතිතුමන්ගේ පදවි ප්‍රාප්තියේ අටවන සැමරුම - විශේෂ පුවත්පත් අතිරේක - සිළුමිණ, සන්ඩේ ඔබ්සවර්, වාරමංජරී, (2013-11-17) දිනමිණ, ඩේලිනිව්ස්, තිනකරන් (2013-11-19) " මැයෙන් සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ කළමනාකරු විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන් ජනපති ධූරයට පත්වී අට වසරක් සපිරීමේ අභිමානවත් මොහොතට සමගාමීව ලේක්හවුස් ආයතනයද රාජ්‍ය මුද්‍රන මාධ්‍ය මගින් භාෂා ත්‍රිත්වයෙන්ම සුවිශේෂී අතිරේක කිහිපයක් ප්‍රකාශයට පත් කිරීම සඳහා කටයුතු සූදානම් කර ඇති බවත් උණුසුම් සුබ පැතුම් වලින් හැඩවන මෙම අතිරේකය සඳහා දැන්වීම් ලබා දීමෙන් දායක වන ලෙසත් දන්වා තිබුණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි පුවත්පත් දැන්වීම් දාන්න හැකියාව තිබෙන්නෙ නගර සභාවෙ දැන්වීම් පමණයි. වෙනත් දැන්වීම් දාන්න බැහැ. ඒක තමුන්නාන්සේලාට පුලුවන් වෙනත් හිතවත් පුද්ගලික මට්ටමකින් කරගන්න කියල මම ඉල්ලීම් කරනවා.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

නමුත් හැම සභාවක්ම දානවා. මේකෙ අඩුම මිල තියෙන්නෙ සිළුම්ණෝ පිටු කාල රු. 64800/- ක් වෙනවා. දිනමිනේ පිටු කාල රු. 32400/- ක් ඩේලිනිව්ස් එකේ පිටු කාල රු. 37100/- ක් වෙනවා.

<u>තීරණය</u>

☛ **මේ සම්බන්ධයෙන් ඡන්දය විමසනු ලදුව පක්ෂව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා, ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මී හේමන්තා මෙනවිය, ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා, ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා යන අයද විපක්ෂව ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා යන අයද ඡන්දය ලබා දුන් අතර වැඩි ඡන්ද 4 කින් මෙම ඉල්ලීම සභා සම්මත විය.**

**දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය පරිදි මේ සඳහා ගෙවීම් කිරීමට අනුමැතිය ලබා ගැනීමට සභාව තීරණය කරන ලදී.**

**11:9** " මල් සහ පැළ ප්‍රදර්ශනය සඳහා ධීවර සංකීර්ණය වෙන් කිරීම වෙනුවෙන් සහනයක් ලබා ගැනීම " මැයෙන් උද්‍යාන විද්‍යා හා මල් වවන්නන්ගේ සංගමයේ ලේකම් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

උද්‍යාන විද්‍යා හා මල් වවන්නන්ගේ සංගමයේ සාමාජික සාමාජිකාවන්ගේ ශ්‍රමයෙන් සූදානම් කර ගත් මල් සහ පැළ ප්‍රදර්ශනයක් 2013- 11- 29 හා 30 දෙදින පෙ. ව. 9. 00 සිට ප. ව. 5.00 දක්වා ධීවර සංකීර්ණ ශාලාවේදී පැවැත්වීමට අදහස් කර ඇති බවත් ඒ සඳහා ධීවර සංකීර්ණ ශාලාව වෙන් කිරීමේදී සහනයක් ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **උද්‍යාන විද්‍යා හා මල් වවන්නන්ගේ සංගමයේ මල් සහ පැළ ප්‍රදර්ශනය සඳහා ධීවර සංකීර්ණ ශාලාව පසුගියවර ලබා දුන් සහනය යටතේම ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

## (12) න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

**12:1** ' ලෝක ළමා දිනය සැමරීම - 2013 ' මැයෙන් ප්‍රජා සංවර්ධන නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

ඔක්තෝම්බර් 01 වන දිනට යෙදුන ලෝක ළමා දිනය සැමරීම නිමිත්තෙන් සංවිධානය කරන ලද ළමා පෙරහැර සහ ළමා සැණකෙළිය වෙනුවෙන් ලබා දෙන ලද අනුග්‍රාහකත්වය සහ ආදායම් වියදම් පිළිබඳ වාර්තාව ඉදිරිපත් තිබුණි.

| <u>අනුග්‍රාහක ආයතන</u> | <u>ලද මුදල්</u> |
|---|---|
| 01) ස්ටැපර්ඩ් මෝටර්ස් සමාගම | රු: 190 000.00 |
| 02) අසංග කුමාරතුංග මහතා | රු: 3 500.00 |
| 03) සම්පත් බැංකුව (අම්බලන්ගොඩ ශාඛාව) | රු: 5 000.00 |
| 04) කොමර්ෂල් බැංකුව (අම්බලන්ගොඩ ශාඛාව) | රු: 25 000.00 |

| | |
|---|---|
| 05) Mr.Chitopher chay sinupore | රු: 110 000,00 |
| 06) සුරංග අම්බලන්ගොඩගේ මහතා | රු: 132 500.00 |
| 07) එච්.ප්‍රේමසිරි මහතා (සුමනදාස ෆුඩ්සිටි) | රු: 44 000.00 |
| 08) ඩේන්ට් මාකටින් සමාගම | රු: 32 000.00 |
| 09) අලියා සිසිල් බීම සමාගම | රු: 30 000.00 |
| 10) සෙලාන් බැංකුව (අම්බලන්ගොඩ ශාඛාව) | රු: 10 000.00 |
| 11) ඒ.උපුල් නලින් ද සිල්වා මහතා | රු: 8 000.00 |
| 12) උදයංජන සිල්වා මහතා | රු: 8 000.00 |
| 13) කේ.පී. සරත් චළු මහතා | රු: 8 000.00 |
| 14) නීල් පුෂ්පකුමාර මහතා | රු: 3 000.00 |
| 15) චතුර කුමාර මහතා | රු: 3 000.00 |
| 16) කේ.පී.අනුර සාලිය මහතා | රු: 3 000.00 |
| 17) ආර්.එම්.එස්.ර්. රත්නායක | රු: 5 000.00 |
| 18) උත්සව දින භූමියෙන් ලද පරිත්‍යාග | රු: 22 318.00 |
| මුළු ආදායම | 642318.00 |

පෙර පාසල් දරු දැරියන්ගේ සහතික පත් මුද්‍රණය කිරීම ලක්බිම පුවත්පත

දරණ ලද වියදම්

| විස්තරය | වියදම රුපියල් |
|---|---|
| 01) උපුල් මාමා ඇතුළු කණ්ඩායම සඳහා වියදම | 67 500.00 |
| 02) ප්‍රධාන වේදිකාව | 30 000.00 |
| 03) සවුන්ඩ්ස් | 42200.00 |
| 04) ජෙනරේටරය | 15 000.00 |
| 05) පාට කොඩි 50 | 15 000.00 |
| 06) පෙරහැරේ නාම පුවරු | 5 500.00 |
| 07) මෙරිගෝ රවුම,පුංචි කෝච්චිය,කතුරු ඔංචිල්ලාව ප්‍රවාහනය සමග | 176 000.00 |
| 08) ගුරු සහතික 600 | 11 340.00 |
| 09) පෝස්ටර් 1000,අත් පත්‍රිකා 1000,ආරාධනා පත්‍ර 150 | 77 700.00 |
| 10) රෙදි හට්ස් | 6 250.00 |
| 11) කොඩි ස්ක්‍රීන් ප්‍රින්ටින් | 4 000.00 |
| 12) බවුන්සර් තැන්පතු මුදල් සමග | 81 500.00 |
| 13) සමරු සටහන් ඵලකය හා අනෙකුත් මුද්‍රණ කටයුතු | 4 720.00 |
| 14) 18X7 ඩිජිටල් බැනර් | 5 500.00 |
| 15) සංග්‍රහ වියදම් | 35170.00 |
| 15) වෙනත් වියදම් | 14212.75 |
| 16) ඡායාරූප සඳහා වියදම් | 16 700.00 |
| | 608292.75 |

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අලියාබීම වෙළඳසැලෙන් ලැබිය යුතු මුදල 20000.00 සහ බවුන්සර් තැන්පතු සඳහා ලැබිය යුතු මුදල 20000.00 ක් තියෙනවා. මේකෙන් ඉතිරි වෙලා තියෙනවා සම්පූර්ණ බැලුවම 74025.25 ක් නගර සභාවෙ සල්ලි සතයක්වත් වියදම් කරල නැහැ. ඒ ගැන මම මන්ත්‍රීවරුන්ට දැනම් දෙනවා.

මෙහිදී මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා සිංහ සමාජයේ සියලුම නිලධාරී මහත්වරුන්ට ඒවගේම නාගරික මන්ත්‍රීවරුන්ට අපේ නිලධාරී මණ්ඩලයට යන සියලුම දෙනාට ස්තුති වන්ත වෙනවා. මෙහිදී මම කියන්න ඕනෙ මේ වියදම කරල අපේ නගර සභාවෙ ළමයින්ට පමණක් පෙන්නල වැඩක් නෑ. මේ උත්සවයෙන් අපට සල්ලි ඉතුරු වෙලා තියෙනවා. මේකෙන් ළමයි විශාල ප්‍රීතියක් ලැබුවා.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

සභාපතිතුමනි අපි ඇත්තටම මේ ගැන සතුටු විය යුතුයි. මෙවැනි වැඩසටහනක් කොහේවත් කෙරිල නැහැ. නගර සභාවෙ මුදල් වියදම් කරන්නෙ නැතුව මෙය ඉටුකිරීම සම්බන්ධව අපි මන්ත්‍රීවරුන් සියලු දෙනාම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. සමහර විට අපට සහයෝගය දෙන්න බැරි වුනත් ඔබතුමා තනියම නිලධාරීන් එක්ක එකතු වෙලා මෙතරම් භාරධූර කටයුත්තක් ඉතා හොඳින් ඉටු කරා.

**ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි ඔබතුමා අම්බලන්ගොඩ නගර සභාවෙ නාමය සමස්ථ දිස්ත්‍රික්කයේම පැතිරෙව්ව. ඒවගේම නගර සභාවට කිසිදු බරක් නොවී කරපු ඒ ක්‍රියාව සම්බන්ධව අපේ ස්තුතිය පුද කරනවා.

**තීරණය**

☛ **මෙම වාර්තාව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:2** ' පස්වන සංවත්සර සැමරුම ' මැයෙන් ලීඩ්ස් ජාත්‍යන්තර පාසලේ විදුහල්පතිතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

පාසලේ දරු දැරියන්ගේ අභිවෘද්ධිය උදෙසා අප පාසලේ පස්වන සංවත්සරයට සමගාමීව 2013- 12- 03 දින ධර්මාශෝක විද්‍යාලයීය ශ්‍රවනාගාරයේදී පවත්වනු ලබන සංගීත ප්‍රසංගය විනෝද බද්දෙන් නිදහස් කර දෙන ලෙස ඉල්ලා තිබුණි. මෙමගින් ලැබෙන මුදල් ප්‍රදේශයේ දිළිඳු දරුවන්ගේ සුභ සිද්ධිය උදෙසා අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමු කර සිදු කරන බවත් දන්වා තිබුණි.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

සභාපතිතුමනි අධ්‍යාපන කටයුත්තක් සම්බන්ධ ව්‍යාපෘතියක් නිසා මේ සඳහා අවසර ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා. මෙහි ප්‍රතිලාභ ප්‍රදේශයේ දිළිඳු දරුවන් වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් තුමියගේ අනුමැතිය යටතේ ලබා දීමට කටයුතු සිදු කරන නිසාත් අපි අවස්ථාවක් සලසා දෙමුයි කියා ඉල්ලා සිටිනවා.

**තීරණය**

☛ **ලිඩ්ස් ජාත්‍යන්තර පාසලේ පස්වන සංවත්සරය වෙනුවෙන් පවත්වන සංගීත ප්‍රසංගය විනෝද බදු වලින් නිදහස් කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:3** ' අම්බලන්ගොඩ නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව ' මැයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සහකාර විගණකාධිපතිතුමා විසින් එවන ලද වාර්තාව සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වාර්තාව ඉදිරිපත් කර තිබූ අතර, එහි මතය ලෙස " මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව අම්බලන්ගොඩ නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට අම්බලන්ගොඩ නගර සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එකී මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ " යනුවෙන් දන්වා තිබුණි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඇත්තවශයෙන්ම අපි සතුටු වෙන්න ඕනෙ නගර සභාවේ මූල්‍ය කටයුතු පිළිබඳව ප්‍රකාශයක් කිරීම පිළිබඳව. මේ සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙන්න ඕනෙ මේ සම්බන්ධව කටයුතු කරපු නිලධාරීන්ට. නිසි මූල්‍ය කළමනාකරණයක් තියෙනව කියන එක තමයි මෙම වාර්තාවෙන් ඔප්පු වෙන්නෙ.

**<u>තීරණය</u>**

☛ **මෙම වාර්තාව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:4** ' අම්බලන්ගොඩ බස් නැවතුම් පොල තුල පැවති කුඩා LED පැනලය ඉවත් කොට විධිමත් LED පැනලයක් සවි කිරීම ' මැයෙන් දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ මහජනතාවට ප්‍රවාහන පහසුකම් උපරිම ආකාරයෙන් සලසා දීම සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ උපදෙස් අනුව අම්බලන්ගොඩ බස් නැවතුම්පොලෙහි අගල් 45 ක පුළුල් තිරයක් සවිකිරීමට තීරණය කර ඇති බවත් එම තිරය මහජනතාවට හොඳින් ප්‍රදර්ශනය වීම සඳහා ක්‍රියාත්මක වූ LED තිරය පැවති ස්ථාන පාලක කුටිය ඉහලින් සවිකිරීමට යෝජනා වී ඇති බවත් ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**<u>තීරණය</u>**

☛ **අම්බලන්ගොඩ බස් නැවතුම්පොලෙහි LED පැනලය සවිකිරීම සඳහා සභා අනුමැතියට යටත්ව අනුමැතිය ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:5** ' කාන්තාභිවෘද්ධි වැඩ සටහනක් පැවැත්වීම ' මැයෙන් ප්‍රජා සංවර්ධන නිලධාරී විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුලුවේදී එහි සභාපති ධූරය ගරු ජනාධිපතිතුමාට ලැබීම පිළිබඳව සුභ පැතුම් ජනතාවගෙන් ලබා ගැනීම සඳහා සංවිධානය කරන ලද රථ පෙරහැරට සමගාමීව රූපවාහිනී සජීවී නුග සෙවන වැඩ සටහන පැවැත්වීමට අදහස් කර ඇති බවත් ඒ සඳහා නගර සභාවේ ශාලා පහසුකම් හා අනෙකුත් පහසුකම් ලබා දෙන ලෙසත් ඉල්ලා රූපවාහිනී සංස්ථාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නිශාන්ත උභයවංශ මහතා විසින් ඉල්ලීම් කර ඇති බවත් ඒ සඳහා වන ඇස්තමේන්තුව (නවාතැන්/ ආහාරපාන/ සංගීත කණ්ඩායම/ නර්තන කණ්ඩායම්/ ලිපි ගොනු කවර/ පෑන්/ විදුලි ආලෝකය/ බැනර්) රු. 47160/- ක් වන බවත් මෙය හදිසි කටයුත්තක් බැවින් සභා අනුමැතියට යටත්ව අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි. තවද පළාත් පාලන ආයතන අතර පැවැත්වෙන කාර්ය සාධන තරගාවලියේදී කාන්තාභිවෘධි වැඩ සටහන් පැවැත්වීම වෙනුවෙන් ලකුණු ලබා දෙන අතර මෙම වැඩ සටහන ඒ සඳහා ඉවහල් වන බවත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☞ **සභා අනුමැතියට යටත්ව අනුමැතිය ලබා දී තිබු රු. 47160/- ක් වු ඇස්තමේන්තුව වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:6** ' ප්‍රාදේශීය සාහිත්‍ය උත්සවය සඳහා නගර ශාලාව ලබා ගැනීම " මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමා විසින් එවා තිබු ලිපිය සභාගත කරන ලදී.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සංවිධානය කරන සාහිත්‍ය උත්සවය 2013- 11- 07 දින අම්බලන්ගොඩ නගර ශාලාවේදී පැවැත්වෙන බවත් ඒ සඳහා මුදල් අය කිරීමකින් තොරව නගර ශාලාව ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **2013- 11- 07 දින පැවැත්වෙන සාහිත්‍ය උත්සවය වෙනුවෙන් නගර ශාලාව මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:7** ' සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම " මැයෙන් සැපයුම් නිලධාරිණිය විසින් ඉදිරිපත් කර තිබු ලිපිය සභාගත කරන ලදී.

2014 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමට අදාල දැන්වීම සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ යන භාෂා තුනෙන් පුවත්පත්වල පල කිරීම සඳහා අනුමැතිය ඉල්ලා තිබුණි.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේ දැන්වීම් තුනම එක පත්තරේක දාන්න. නැත්තම් වියදම වැඩියි.

<u>තීරණය</u>

☞ **2014 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමට අදාල දැන්වීම සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ යන භාෂා තුනෙන්ම එක් පුවත්පතක පල කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:8** ‘ Unplugged සංගීත ප්‍රසංගය වෙනුවෙන් විනෝද බදු මුදල් නිදහස් කරවා ගැනීම ’’ මැයෙන් ධර්මාශෝක විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

Unplugged සංගීත ප්‍රසංගයේ ලැබීම් හා ගෙවීම් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර තිබූ අතර එහි ආදායම රු. 1168000.00 ක් බවත් වියදම රු. 909152.50 ක් බවත් ප්‍රසංගයෙන් ලද ලාභය රු. 258847.50 ක් බවත් එම ලාභය පාසල වෙත පරිත්‍යාග කල බවත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☛ **Unplugged සංගීත ප්‍රසංගය වෙනුවෙන් විනෝද බදු මුදල් නිදහස් කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:9** ‘ අම්බලන්ගොඩ රුහුණු කවි සමාජයේ වාර්ෂික උත්සවය සඳහා නගර ශාලාව නොමිලයේ ලබා ගැනීමට කරන ඉල්ලීම “ මැයෙන් සංගමයේ ලේකම් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

2013 නොවැම්බර් 24 දින පැවැත්වෙන රුහුණු කවි සමාජයේ වාර්ෂික උත්සවය සඳහා නගර ශාලාව , පිත්තල පහන, ජාතික කොඩි, කොඩි කණු 10 ක් සහ ප්ලාස්ටික් පුටු 25 ක්ද නොමිලේ ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **රුහුණු කවි සමාජයේ වාර්ෂික උත්සවය සඳහා නගර ශාලාව ඇතුලු අනෙකුත් ඉල්ලීම් මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:10** ‘ ප්‍රවේශ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධවයි “ මැයෙන් අම්බලන්ගොඩ පෝරඹ, තොටුපොල පටුමග ඒ. පී. සෝමචන්ද්‍ර මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

මෙම මාර්ගය පුද්ගලික පාරක් නොවන බවත් අවුරුදු 100 ගණනක් පැරණි සෑහෙන තරම් කාලයක සිට පාවිච්චි කරනු ලබන මාවතක් බවත් මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කර දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙහිදී අපේ නිලධාරී වාර්තාව දීල තියෙනව ආරම්භක ස්ථානය අඩි 10 යි පස්සෙන් අඩි 5 වෙනකන් කුඩා වෙනව කියලා. මේක කලින් උපාලි සිරිසුමන මහත්මය හඳපු නිවාස යෝජනා ක්‍රමය. මෙතන පාර හදල දෙන්න කියල කියන්නෙ. ජයන්ත මහත්මය මේකෙ අයිතිය පිළිබඳ අවශ්‍යද එතකොට.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**</u>

මේක ජේ. ඩබ්. ප්‍රනාන්දු මහත්මයගෙ මාමට තිබුණ ඉඩමක්. දෙමාපියන් මැරුන. ඊට පස්සෙ කැමැත්ත දුන්න මේක කරන්නෙයි කියලා. ඊට පස්සෙ නගර සභාව මැදිවෙලා මේක කැබලි කරලනිවාස අධිකාරියෙන් ණයක් අරන් දුන්නා. හැබැයි මට ප්‍රශ්නයක් තියෙනවා මේක ඔප්පුවකින් ගත්තද කියන එක. මම ඔබතුමාට කියන්නෙ සේරම දේවල් මේ යකඩ සේප්පුවේ තමයි තිබ්බෙ. පෝරඹ පුස්තකාලය, සතොස ඒවගේ ඔප්පු සියල්ලම සේප්පුවේ තිබුණ. මම කියනවා මේකෙ මොනවහරි ඇති ටිකක් සොයා බලන්න.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මම යෝජනාවක් වශයෙන් කරන්න කැමතියි මේකෙ අයිතිකරු පිළිබඳ ගැටලුවක් නම් පාර හදන්න සභාවෙ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය**

☞ **මෙම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීමට සභාව තීරණය කරන ලදී.**

**12:11** ' අඩි පාරක් නගර සභාවට පැවරීම පිළිබඳවයි " මැයෙන් අම්බලන්ගොඩ පොල්වත්ත අංක 216 හි ඕ. කේ. පී. ජයවර්ධන මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

තමාහට අයත් නිවසට යාම සඳහා අඩි 03 ක පාරක් ඇති බවත් එම පාර තවත් නිවාස තුනකට එනම් එස්. පී. එස්. පැට්රිෂියා, ඕ. කච්මිනි කුමාරි ජයවර්ධන සහ තරිඳු ඉසංක නදීශාන් යන අයගේ නිවාස වලට යාම සඳහා භාවිතා කරන බවත් එම පාර නගර සභාවට පවරාගෙන සංවර්ධනය කර දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**තීරණය**

☞ **මෙම මාර්ගය නගර සභාවට පවරාගෙන සංවර්ධනය කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:12** ' පින්නදූව II හරස් පාරේ ඥාණසිරි මහතාගේ නිවස අසල පැතිබැම්ම ඉදිකිරීම සඳහා වූ වියදම " මැයෙන් වැඩ අධිකාරී මහතා විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

පින්නදූව II හරස් පාරේ ඥාණසිරි මහතාගේ නිවස අසල පැතිබැම්ම ඉදිකිරීම සඳහා වූ වියදම රු. 13605.00 ක් බව දන්වා තිබුණි.

**තීරණය**

☞ **මෙම වාර්තාව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:13** ' සුව කැදැල්ල සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන " මැයෙන් අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමිය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

" සුව කැදැල්ල " සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් මාලාවේ අම්බලන්ගොඩ කොට්ඨාශයේ වැඩසටහන 2013 ඔක්තෝම්බර් 31 දින දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් නගර ශාලාවේදී පැවැත්වීමට කටයුතු යොදා ඇති බවත් ඒ සඳහා අවශ්‍ය ශාලා පහසුකම්, ආසන පහසුකම්, ශබ්ද විකාශන යන්ත්‍ර පහසුකම්, පොල්තෙල් පහන, මාර්ගය වර්ණ කොඩි වලින් සැරසීම, කොඩි කණු, සංග්‍රහ කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

මම එම්. ඕ. එච්. එකට යනවා. ඒ යන දවසක වැස්ස වෙලාවක බිත්ති දිගේ වතුර ඇවිල්ල ත්‍රිපෝෂ තෙමිල හානි වෙලා තිබුණා. අරහෙන් පොල් ගස් දෙක තියෙනවා. අනිත් එක කොට්ටම්බ කොල පිරිල වහලෙ. ඒ නිසා සමහර විට වතුර

බහින්නෙ නැතුව ඇති. මම වැඩ අධිකාරි මහත්මයට කියනවා ඉක්මනින්ම ගිහිල්ල බලල ඒ වහල අලුත්වැඩියා කරන්න කියලා. මොකද ගැබිනි මව්වරුන් එනවා මෙතන වැස්සදාට තෙමිල ටයිල් එකේ යන්න බැහැ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

වැඩ අධිකාරි මහත්මය ඒක ඉක්මනින් කරන්න.

**තීරණය**

☛ **" සුව කැදැල්ල " සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන සඳහා ඉල්ලා ඇති පහසුකම් ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:14** ' THW නිවාස සඳහා ඔප්පු ලබා දීම ' මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

THW නිවාස සඳහා ඔප්පු ලබා දීම සඳහා ඉල්ලා ඇති මු. පි. ගා. 3780 සිතියම හා ඊට අදාල කට්ටි නාම ලේඛනය එවන බව දන්වා තිබුණි.

**තීරණය**

☛ **THW නිවාස වලට ඔප්පු ලබා දීම සඳහා නිසි පරිදි සකස් කරන ලද පරිපාලන යෝජනාව ඊළඟ සභා වාරයට ඉදිරිපත් කොට මෙම කාර්ය ඉටු කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:15** ' අනුරාධපුර මහා නගර සභා සංචාරක බංගලාව බැතිමතුන්ගේ පහසුව සඳහා නවත ආරම්භ කිරීම ' මැයෙන් අනුරාධපුර මහ නගර සභාවේ නාගරික කොමසාරිස්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අනුරාධපුර මහා නගර සභාවට අයත් සංචාරක බංගලාව මේ වන විට විවෘතව ඇති බවත් මෙය විශේෂිත වූ සිද්ධස්ථාන වලට ආසන්නව පිහිටා ඇති බවත් සාධාරණ මිල ගණන් යටතේ මෙම සංචාරක බංගලාව වෙන් කරවා ගත හැකි බවත් දන්වා තිබුණි.

**තීරණය**

☛ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:16** ' නගර සභා ක්‍රිකට් ඇකඩමියට ආධාර පිණිස පවත්වනු ලබන සංගීත සංදර්ශනය- 2013 ' මැයෙන් අම්බලන්ගොඩ නගර සභා ක්‍රිකට්ඇකඩමි මාපිය සංගමය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභා ක්‍රිකට් ඇකඩමි මාපිය සංගමය විසින් ඇකඩමියේ පුහුණුව ලබන ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ ක්‍රිකට් අවශ්‍යතා සපුරාලීමට ආධාර පිණිස 2014- 01- 31 දින පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණයේදී සංගීත ප්‍රසංගයක් පැවැත්වීමට අදහස් කර ඇති බවත් මෙයින් ලැබෙන ආදායම ඇකඩමියේ අවශ්‍යතා සඳහා යෙදවීමට බලාපොරොත්තු වන බවත් මේ සඳහා වන විනෝද බදු මුදල නිදහස් කරවා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**තීරණය**

☛ **නගර සභා ක්‍රිකට් ඇකඩමියට ආධාර පිණිස පවත්වනු ලබන සංගීත සංදර්ශනය විනෝද බදු වලින් නිදහස් කර දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:17** ' බලපිටිය දිසා අධිකරණයේ අංක 2746/එල් දරණ නඩුව සම්බන්ධවයි " මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිගොනුව සභාගත කරන ලදී.

ඔබ නගර සභාවද විත්තියේ පාර්ශවයක් කරමින් පවරන ලද නඩු විභාගයේදී මෙම සංස්ථාව විසින් ප්‍රකාශ කර ඇත්තේ දැනට ඇල රක්ෂිතය ලෙස පවත්නා මෙම සංස්ථාව සතු ඉඩම් තීරුව පැමිණිලි පාර්ශවයට ප්‍රවේශ මාර්ගයක් ලෙස පාවිච්චි කිරීමට මෙම සංස්ථාවේ විරුද්ධත්වයක් නොමැති බවත් එහෙත් මෙම බිම් තීරුව ප්‍රවේශ මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීමට මෙම සංස්ථාව එකග වී නොමැති බවත් මෙම ඉඩම් කොටසේ මාර්ගයක් ඉදි කිරීමට මෙම සංස්ථාවට හැකියාවක් නොමැති බවත් මෙම ව්‍යාපෘතියෙන් විශාල පාඩුවක් දැරීමට මෙම සංස්ථාවට සිදුවී ඇති බවත් කරුණු මෙසේ හෙයින් මාර්ගයක් ඉදිකිරීමට මෙම සංස්ථාවට හැකියාවක් නොමැති බවත් දන්වා තිබුණි. කෙසේ වෙතත් නගර සභාව සහ පැමිණිලිකාර පාර්ශවය මෙම මාර්ගය ඉදිකිරීමට පියවර ගන්නේ නම් මෙම සංස්ථාවට අයත් ඉඩම් තීරුවේ මායිම් මිනින්දෝරු මහතෙකු ලවා පෙන්වා නගර සභාවට භාර දිය හැකි බවද දන්වා තිබුණි.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නඩුවක් තිබුන හල්වතුරෙ ඇලෙන් පාරක් නැතිවුනා කියල ඇලෙන් මෙහා පැත්තෙ එක්කෙනෙක් නඩුවක් දැම්ම. ඒ අයට දුන්න පෝරොක් ඇල අයිනෙන් යන්න. මේක ප්‍රතිපාදන ලැබුනොත් අපි හදාගමු.

**තීරණය**

☛ **හල්වතුර ඇල රක්ෂිතය බිම් තීරුවේ මාර්ගය ඉදි කිරීමට ප්‍රතිපාදන ලබාගත හැකි නම් නගර සභාව මගින් සිදු කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:18** ' කොම්ප්‍රෙෂර් එකක් ලබා ගැනීම " මැයෙන් අම්බලන්ගොඩ නගර සභාවේ වැඩ පරිපාලක මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

දැනට කර්මාන්ත අංශයේ ඇති කොම්ප්‍රෙෂරය ක්‍රියාවිරහිතව ඇති බවත් එය අලුත් වැඩියා කලද ප්‍රමාණවත් නොවන බවත් වාහන කිහිපයක්ම සේවා කටයුතු කිරීමට ඇති බවත් එම නිසා ලීටර 250 හෝ 300 පමණ වන කොම්ප්‍රෙෂර් එකක් ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා තිබුණි.

**තීරණය**

☞ **ලිටර 250 හෝ 300 ප්‍රමාණයේ කොම්ප්‍රෙෂර් එකක් නගර සභාවට අලුතින් මිලදී ගැනීමටක්‍රිකට් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:19** ' පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය හා පාරිසරික සමතකරණය පිළිබඳ එක්දින පුහුණු වැඩසටහන' මැයෙන් සංවර්ධන සහකාර (පරිසර) මහත්මිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ඉහත එක් දින පුහුණු වැඩ සටහන අම්බලන්ගොඩ නගර සභාව, අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව සහ හික්කඩුව ප්‍රාදේශීය සභාව යන ආයතන තුනෙහි සභාපතිතුමා, ලේකම් හා පරිසර විෂය සම්බන්ධ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා පවත්වන බවත් එහි දේශන සඳහා සම්පත් දායකත්වය මධ්‍යම පරිසර අධිකාරාය සපයනු ලබන බවත් ශාලා පහසුකම් සහ සංග්‍රහ වියදම් අප සභාවෙන් දැරීමට අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය හා පාරිසරික සමතකරණය පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා රු. 6250/- ක වියදම් දැරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:20** ' තල්ගස්ගොඩ, පල්ලෙතොට පාර III වන පටුමග සංවර්ධනය කිරීම සඳහා නගර සභාවට පවරා දීම ' මැයෙන් කේ. ඒ. ආර්. කුමාරතුංග, කේ. එම්. කුමාරතුංග, යූ. පී. රත්නසිරි, කේ. එම්. කුමාරතුංග, එම්. ඩබ්. ඩී. එස්. ජයවර්ධන යන මහත්මාවන් විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ඉහත නම් සඳහන් අයගේ නිවාස වලට ප්‍රවේශ වන මාර්ගය නගර සභාවට පවරාගෙන සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **බලයලත් මානක මාදුවගේ තේජසිරි මහතාගේ 804A පිඹුරේ නිරූපිත E1A කැබැල්ල නගරසභා පාරක් වශයෙන් පවරාගෙන සංවර්ධනය කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:21** ' සුප්‍රිම් මේලා වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය ' මැයෙන් රත්ගම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

රත්ගම දේවිනිගොඩ සුප්‍රිම් ක්‍රීඩා සමාජය මගින් සංවිධානය කරනු ලබන සුප්‍රිම් මේලා වෙළඳ සැණකෙළිය හා ප්‍රදර්ශනය පිළිබඳ දැන්වීමක් අම්බලන්ගොඩ නගරයේ නොමිලයේ ප්‍රදර්ශනය කිරීම සඳහා අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **සුප්‍රිම් මේලා වෙළඳ සැණකෙළිය හා ප්‍රදර්ශනය පිළිබඳ දැන්වීමක් අම්බලන්ගොඩ නගරයේ නොමිලයේ ප්‍රදර්ශනය කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:22** ‘ උපමාන පාදක 2013 තල්ගස්ගොඩ පුංචි පාලම අසළ සිට මහ පාලම දක්වා මාර්ගය අයිනේ එක් පැත්තක ශරීර සුවතා මංතීරු ඉදිකිරීම “ මැයෙන් 2013-10-30 දාතමින් දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභාව මගින් ඇගයීම සඳහා ඉදිරිපත් කර ඇති ටෙන්ඩර් පත් දෙකෙහිම අවශ්‍ය පරිදි ලංසු ඇපකරය නොතිබීම නිසා ටෙන්ඩර්පත් දෙකම ප්‍රතික්ෂෙප කිරීමට සිදුවන බවත් මේ සඳහා අවශ්‍ය ඉදිරි පියවර ගන්නා ලෙසත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☛ **මෙම කර්මාන්තය 2013 දෙසැම්බර් මාසයට පෙර නිම කළ යුතු බැවින්ද, නැවත ටෙන්ඩර් කිරීමේදී පුවත්පත් දැන්වීම් සඳහා රු. 53760.00 ක මුදලක් ගෙවීමට සිදුවන බැවින්ද, නැවත ටෙන්ඩර් කිරීමට කාලය ප්‍රමාණවත් නොවන බැවින්ද යන කරුණු සලකා බලා ඉදිරිපත් කර ඇති ටෙන්ඩර් දෙක ඇගයීමට ලක් කර සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා දෙන ලෙසත් එම ටෙන්ඩර්කරුට අදාල ලංසු ඇපකර මුදල සභාවේ තැන්පත් කිරීමෙන් අනතුරුව කර්මාන්තයේ වැඩ ආරම්භ කිරීමට අනුමැතිය ලබා දෙන ලෙසත් නැවත ඉල්ලීමක් කිරීමට සභාව තීරණය කරන ලදී.**

**12:23** ‘ මාර්ගය සකස් කර දෙන ලෙස කෙරෙන ඉල්ලීම “ මැයෙන් එච්. ටී. විනී, රත්නසිරි ගාල්ලගේ, එච්. ටී. ඕලානි, රංගි උපේක්ෂා ගාල්ලගේ, එම්. තලතා චන්ද්‍රිකා ද සිල්වා, එන්. එච්. සුනිල්, එන්. එච්. සේතුහේවා යන මහත්ම මහත්මීන් විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

හින් ඇල පාරේ සිට දුම්රිය මාර්ගය දක්වා වු අපගේ ඉඩම් හරහා වැටී ඇති කෙටි මාර්ගය ගල් අතුරා සකස් කර දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **හින් ඇල පාරේ සිට දුම්රිය මාර්ගය දක්වා වු මාර්ගය නගර සභාවට පවරාගෙන සංවර්ධනය කිරීමට සභාව තීරණය කරන ලදී.**

**12:24** ‘ අභ්‍යාස පොත් ප්‍රදානය- 2013 “ මැයෙන් ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

2014 වර්ෂය සඳහා නගර සභා බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් වල දරු දැරියන්ට නොමිලේ අභ්‍යස පොත් බෙදාදීමට සමගාමීව නගර සභාවේ සේවයේ නියුතු නිලධාරී හා සේවක මහත්ම මහත්මීන්ගේ පාසල් යන දරු දැරියන් සඳහා ද අභ්‍යාස පොත් ලබා දීමට අනුමැතිය ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **නගර සභාවේ සේවයේ නියුතු නිලධාරී හා සේවක මහත්ම මහත්මීන්ගේ පාසල් යන දරු දැරියන් සඳහා ද අභ්‍යාස පොත් ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:25** ‘ ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ කාගිල්ස් FA කප් පාපන්දු තරගාවලිය - 2013 “ මැයෙන් නගර සභා පාපන්දු සංචිතයේ පුහුණුකරු විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

නගර සභා පාපන්දු සංචිතය හා ගල්කිස්ස රෙඩ් ස්ටාර් ක්‍රීඩා සමාජය සමග රත්මලාන දුම්රිය ක්‍රීඩා පිටියේදී 2013- 11- 03 දින පැවැත්වීමට නියමිත බවත් ඒ සඳහා සහභාගි වීමට රත්මලාන දක්වා යාමට කුඩා ප්‍රමාණයේ බස් රථයක් වෙනුවෙන් රු. 10500/- ක මුදලක් වැය වන බවත් ඒ සඳහා අනුමැතිය ලබා ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **පාපන්දු තරගය සඳහා සහභාගී වීමට රත්මලාන දක්වා බස් රථයකින් ගමන් කිරීම වෙනුවෙන් ඒ සඳහා වන ගාස්තුව ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:26** ‘ වාර්ෂික විනෝද චාරිකාව සඳහා මුදල් ලබා ගැනීම “ මැයෙන් නගර සභා සුහද සේවක සේවිකාවන්ගේ සුභ සාධක සංගමයේ ලේකම්තුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

නගර සභා සුහද සේවක සේවිකාවන්ගේ සුභ සාධක සංගමයේ වාර්ෂික විනෝද චාරිකාව 2013 දෙසැම්බර් මස 20, 21, 22 යන දිනවලදී යාමට තිරණය කර ඇති බවත් ඒ සඳහා සභාවෙන් ලබා දෙන රු. 50000/- ක මුදල සංගමයට ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **නගර සභා සුහද සේවක සේවිකාවන්ගේ සුභ සාධක සංගමයේ වාර්ෂික විනෝද චාරිකාව සඳහා රු. 50000/- ක මුදලක් ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

✪ වෙනත් කරුණු නැත

**ප. ව. 1.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

එස්. ඩී. රාමනායක,
ප්‍රධාන කළමනාකරණ සහකාර,
අම්බලන්ගොඩ නගර සභාව.

ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප්,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

**2013 – 11 – 22 දින,**
**අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.**